කාලො ඝසති භූතානි—සබ්බානෙව සහත්තනා
යො ච කාලඝසො භූතො—සභූතපචනිං පචි.

**ස්කන්ධාදීන්ගේ විභාගය නිමි.**

---

මෙම ග්‍රාථා පොතේ අන්තිම බැවින් සන්න නොලිවෙමු. එහි විස්තර ඉහතකී ප්‍රකාරයෙන් බලා දැනගත යුතු.

---

# නව අරහාදි බුදුගුණ විභාගය.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස.**

---

11 "ආරකත්තා හතත්තා ච-කිලෙසාරීන සො මුනි
හතසංසාරචක්කාරො-පච්චයාදීන චාරහො
න රහො කරොති පාපානි-අරහන්තෙන පවුච්චති"

යනුහෙයින් බුදුහු කෙලෙසුන්කෙරෙන් ඉතා දුරසිටිහෙයින් "අර්හත්" නම් වනසේකි—කෙසේ දුරසිටිසේක්ද යතහොත්? අර්හත් මාර්ගයෙන් වාසනාසහිතකොට ක්ලේශක්ෂයකළ හෙයින් ඉතා දුර සිටි සේකි.

මේ වාසනා නම් කවරක්ද යත්? ක්ලේශක්ෂයකළ ක්ෂීණාශ්‍රව සන්තානයෙහිද ක්ලේශක්ෂයනොකළාහුගේ කාය වාක් ප්‍රයොගය හා සදෘශවූ දුටු ඇසූ අන්‍යසත්ත්වයන්ට අප්‍රසාදකර කාය වාක් ප්‍රයොගයට හෙතුවූ නෂ්ටවූ කෙලෙසුන්විසින් තබාලාගිය තමන්ගේ සාමර්ථ්‍ය විශෙෂය 'වාසනා' නම් වේ-මේ වාසනාව බුද්ධත්ව මුත් සෙසු රහතුන්ට ඇති-බුදුහු මේ වාසනාව හා සමග ක්ලේශක්ෂයකළහෙයින් සර්වක්ලේශයන් කෙරෙන් ඉතා දුරුවූසේකි-එහෙයින් "ආරාද්හතත්ත්වාදර්හන්"යන මේ වාක්‍යයෙහි ගත්‍යර්ථ පඨිත "හන-හිංසායාම්" යන ධාතුහුගේ වශයෙන් "අර්හත්" නම් වන සේකි.

---

11 සොමුනි, ඒ සර්වඥතෙම, කෙලෙසාරීනං, කෙලෙස් සතුරන් ආරකත්තා, දුරුකළ හෙයින්ද, හතත්තාච, නැසූබැවින්ද අර්හත් යයි කියනුලැබේ, (එසේම ඒ සර්වඥතෙමු) හතසංසාරචක්කාරො, නසනලද සංසාර චක්‍රයාගේ අර ඇතිසේක, පච්චයාදීනඤ්ච, චීවරාදි ප්‍රත්‍යයන්ටද; අරහො, සුදුසුවනසේක; රහො, රහසිව; පාපානි, පව්; නකරොති, නොකාරණසේක; තෙන, ඒ කාරණයෙන්ද; අරහං, අර්හත්යයි; පවුච්චති, කියනුලැබේ.

12 "සො තතො ආරකා නාම-යස්ස යෙනා සමඞ්ගිතා
අසමඞ්ගි ච දෙසෙහි-නාථො තෙනාරහං මතො"

යනු එහෙයින්ම කියනලදී-තවද බුදුහු අර්හත්මාර්ගඥානය කරණකොටගෙණ කෙලශශත්‍රූන් නැසූ හෙයින් "අර්හත්" නම් වනසේකි-මෙහි කෙලශයෝම මෙලොව පරලොව සර්වානර්ථ කරවන බැවින් සතුරන් වැනිවෙත්-බුදුහු මෙබඳු රාගාදී කෙලශ නැමති සතුරන් මාර්ගඥාන නැමති ශස්ත්‍රයෙන් සමූලඝාතව නැසූසේකි-එහෙයින් "අරීණංහතත්වාදර්හන්" යන වාක්‍යයෙහි අරිශබ්දෙපපදවූ හිංසාර්ථ පඨිත "හන-හිංසායාම්" යන ධාතුහු කෙරෙන් ලට් ප්‍රත්‍යය ශත්‍රාදෙශයෙනුත්'අර්හත්' නම් වන සේකි.

13 "යස්මා රාගාදිසංඛාතා-සබ්බෙපි අරයො හතා
පඤ්ඤාසත්ථෙන නාථෙන-තස්මාපි අරහං මතො"

යනු එහෙයින්ම කියනලදී—තවද බුදුහු සංසාරචක්‍රයාගේ අරසංඛ්‍යාතවූ දූවි කැපූහෙයිනුත් "අර්හත්" නම් වන සේකි.

මෙහි 'සංසාරචක්‍රය' නම් කිමෙක්ද යත්?

14 "ඛන්ධානං පටිපාටි-ධාතුආයතනානච
අබ්බොච්ඡින්නානං වත්තමානං-සංසාරො ති පවුච්චති"

---

12 යස්ස, යමෙක්හුගේ; යෙන, යමකින්; අසමඞ්ගිතා, අසම්ප්‍රයුක්ත භාවයක් වේද; සො, හේතෙම; තතො, එයින්; ආරකා නාම, දුරුවූයේ නම්; නාථො, සර්වඥතෙම; දෙසෙහි, දෙස් වලින්; අසමඞ්ගීච, අසම්ප්‍රයුක්තදවනසේක; තෙන, එයින්; අරහං, අර්හත්යයි; මතො, දක්නාලදී.

13 යස්මා, යම්හෙයකින්; නාථෙන, සර්වඥයන්වහන්සේ විසින්; පඤ්ඤාසත්ථෙන, ඥානශස්ත්‍රයෙන්; රාගාදිසංඛාතා, රාග ද්වෙෂාදි යයි කියනලද; සබ්බෙපි අරයො, සියළුසතුරෝ; හතා, නසන ලද්දාහුද; තස්මාපි, එහෙයින්ද; අරහං, අර්හත්යයි; මතො දත්නාලදී.

14 ඛන්ධානං, පඤ්චස්කන්ධයන්ගේද; ධාතු ආයතනානඤ්ච, අෂ්ටාරස ධාතු ද්වාදසායතනයන්ගේද; අබ්බොච්ඡින්නානං, නොසිඳීමෙන්; වත්තමානං, පවත්නාවූ; පටිපාටි, පිළිවෙළ; සංසාරොති, සසරයයි; පවුච්චති, කියනුලැබේ.

යනුහෙයින් අනවරාග්‍ර සංසාරයෙහි භවයෙන්භවයකොසිඳ පවත්නා "රූප, වෙදනා, සංඥා, සංස්කාර, විඥාන" යන පංචස්කන්ධයන්ගේ පටිපාටියද "චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු ඝානධාතු ගන්ධධාතු ඝානවිඤ්ඤාණධාතු ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු කායධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු" යන මේ අටළොස් ධාතුන්ගේ පටිපාටියද "චක්ඛායතන සොතායතන ඝානායතන ජිව්හායතන කායායතන මනායතන රූපායතන සද්දායතන ගන්ධායතන රසායතන ඵොට්ඨබ්බායතන ධම්මායතන" යන මේ ද්වාදශායතනයන්ගේ පටිපාටියද සංසාර' නම් වේ—

එයම නානාගති පරිභ්‍රමණය කරණ වටාගෙණයන නයෙන් 'චක්‍ර' නමුදුවේ.

### එහි පඤ්චස්කන්ධය නම්

15 "භූතප්පසාදවිසයා—භාවො හදය මිච්චපි
ජීවිතාහාර රූපෙහි—අට්ඨාරසවිධං තථා"

යනුහෙයින් සතබ්ධලක්ෂණවූ පෘථිවීධාතුය, ද්‍රවලක්ෂණවූ ආපොධාතුය, උෂ්ණත්වලක්ෂණවූ තෙජොධාතුය, විස්ඵරණලක්ෂණවූ වායොධාතුය, යනභූතරූපය; රූපදර්ශනයට කාරණවූ චක්ෂුඃප්‍රසාදය, ශබ්දශ්‍රවණයටකාරණාවූශ්‍රොත්‍රප්‍රසාදය, ගන්ධාඝ්‍රාණයට කාරණවූ ඝ්‍රාණප්‍රසාදය, රසාස්වාදයටකාරණවූජිව්හාප්‍රසාදය, ස්පර්ශග්‍රහණයට කාරණවූ කායප්‍රසාදය, යන ප්‍රසාදරූපය, චක්ෂුෂට ගොචරවූ රූපාලම්බනය, ශ්‍රොත්‍රයට ගොචරවූ ශබ්දාලම්බනය, ඝ්‍රාණයට ගොචරවූ ගන්ධාලම්බනය, ජිව්හාවට ගොචරවූ රසාලම්බනය, කායෙන්ද්‍රියට ගොචරවූ ස්පර්ශාලම්බනය, යනවිෂය රූපය; ස්ත්‍රීභාව පුරුෂභාවය; මනොධාතු මනොවිඤ්ඤාණධාතුන්ට ආධාරවූ හෘදයවස්තුවය; දෙහස්ථිතියට කාරණවූ රූප ජීවිතෙන්ද්‍රියය; ශරීරය පවත්නාවූ ඔජාරූපය; යන මේ අටළොස් වැදෑරුම්වූ රූපයෝ "රූපස්කන්ධ" නම් වෙත්-ඉෂ්ටානුභවන ලක්ෂණවූ සුඛවෙදනාවය, අනිෂ්ටානුභවනලක්ෂණවූ දුඃඛවෙදනාවය, මධ්‍යස්ථානුභවනලක්ෂණවූ

---

15. භූත, භූතරූපය; පසාදා, ප්‍රසාදරූපය; විසයා, විෂයරූපය; භාවො, පුම්භාවාදිභාවරූපය; හදයමිච්චපි, හෘදය රූපයද; තථා, එසේම; ජීවිතාහාරරූපෙහි, ජීවිතරූප ඔජාරූපයන්සමග; අට්ඨාරස විධං, (මේ කර්මජරූපය) අටළොස් ආකාරවේ.

උපෙක්ෂා වේදනාවය, යන වේදනාත්‍රය"වේදනාස්කන්ධ"නම්වේ- රූපාදී අරමුණු ඇඳිනගැන්ම ස්වභාවකොටඇති සංඥාව "සංඥා ස්කන්ධ" නම්වේ.—

16 "සඞ්ඛාරො චෙතනා ඵස්සො-මනක්කාරායුසණ්ඨිති
තක්කො චාරො ච වායාමො-පීති ඡන්දාධිමොක්ඛතා-

17 සද්ධාසතිහිරොත්තප්පං-චාගො මෙත්තා මතී පුන
මජ්ඣත්තතා ච පස්සද්ධි-කායචිත්තවසා ද්වෙ-

18 ලහුතා මුදුකම්මඤ්ඤ-පාගුඤ්ඤුජ්ජුතා තථා
දයාමුදූසම්මාවාචා-කම්මන්තා ජීවසංවරො-

19 ලොභො දොසො ච මොහො ච-දිට්ඨිඋද්ධච්ච මෙව ච
අහිරීක මනොත්තප්පං-විචිකිච්ඡිත මෙව ච-

20 මානො ඉස්සා ච මච්ඡෙරං ච-කුක්කුච්චං ථිනමිද්ධකං
ඉති එතානි පඤ්ඤාස-සංඛාරක්ඛන්ධ සඤ්ඤිතා"

---

16 සඞ්ඛාරො සංස්කාරස්කන්ධය (කෙසේද); චෙතනා, චෙතනාවය; ඵස්සො, ස්පර්ශය; මනක්කාරො, මනස්කාරය; ආයු, අරූපජීවිතෙන්ද්‍රියය; සණ්ඨිති, එකාග්‍රතාවය; තක්කො, විතර්කය; චාරොච, විචාරයද; වායාමො, වීර්යයද; පීති, ප්‍රීතියද; ඡන්දො, ඡන්දයද; අධිමොක්ඛතා, අධිමොක්ෂයද.

17 සද්ධා, ශ්‍රද්ධාවද; සති, ස්මෘතියද; හිරොත්තප්පං, හිරිඔතප් දෙකද; චාගො, අලොභයද; මෙත්තා, අද්වෙෂයද; මතී, අමොහයද; පුන, නැවත; මජ්ඣත්තතාව, තත්‍රමධ්‍යස්ථතාවයද; කායචිත්තවසා, කායචිත්තවශයෙන්; ද්වෙපස්සද්ධි, කායපස්සද්ධි චිත්තපස්සද්ධි දෙක්ද;

18 තථා, එසේම; ලහුතා, කායලඝුත්ව චිත්තලඝුත්ව දෙකද; මුදු, කායමෘදුත්ව චිත්තමෘදුත්ව දෙකද; කම්මඤ්ඤ, කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා දෙකද; පාගුඤ්ඤ, කාය පාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා දෙකද; උජ්ජුතා, කාය ඍජුතා චිත්තඍජුතා දෙකද; දයා, කරුණාවද; මුදු, මුදිතාවද; සම්මාවාචා, සම්‍යක් වචනයද; කම්මන්ත, සම්‍යක්කර්මාන්තයද; ආජීවසංවරො, සම්‍යක් ආජීවයද;

19 ලොභො, ලොභයද; දොසොච, ද්වෙෂයද; මොහොච මොහයද, දිට්ඨි, මිථ්‍යාදෘෂ්ටියද; උද්ධච්චමෙවච, ඖද්ධත්‍යයද; අහිරිකං,

යනුහෙයින් චෙතනාවය, ස්පර්ශය, මනස්කාරය, අරූපජීවිතෙන්ද්‍රියය, එකාග්‍රතාවය, විතර්කය, විචාරය, ව්‍යායාමය, ප්‍රීතිය, ඡන්දය, අධිමොක්ෂය ශ්‍රද්ධාවය, ස්මෘතිය, හිරිය, ඔත්තප්පය, අලොභය, අද්වෙෂය' අමොහය, තත්‍රමධ්‍යස්ථතාවය, කායපස්සද්ධි චිත්තපස්සද්ධි දෙදෙනාය, කායලඝුතා චිත්තලඝුතා දෙදෙනාය, කායමෘදුතා චිත්තමෘදුතා දෙදෙනාය, කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා දෙදෙනාය, කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා දෙදෙනාය කායඍජුතා චිත්තඍජුතා දෙදෙනාය, කරුණාවය, මුදිතාවය, සම්‍යග්වාචාය, සම්‍යක්කර්මාන්තය, සම්‍යගාජීවය, ලොභය, ද්වෙෂය, මොහය, මිථ්‍යාදෘෂ්ටිය, ඖද්ධත්‍යය, අහිරිකය, අනපත්‍රපාය, සංශය, මානය, ඊර්ෂ්‍යාවය, මාත්සර්යය, පශ්චාත්තාපය, ථිනය, මිද්ධය, යන මේ පනස්චෛතසික ධර්මයෝ "සංස්කාරස්කන්ධ" නම් වෙත්-විෂය විජානනලක්ෂණයෙන් එකවිධවූ කුසලාකුසල අව්‍යාකෘත වශයෙන් ත්‍රිවිධවූ කාමාවචර රූපාවචර අරූපාවචර ලොකොත්තරවශයෙන් චතුර්විධවූ වෙදනා සංඥා සංස්කාරාදි භෙදයෙන් එකූනනූවක් පමණැති චිත්තය "විඥානස්කන්ධ" නම්වේ—මේ පඤ්චස්කන්ධයෙහි.

"ඵෙනපිණ්ඩූපමං රූපං—වෙදනා බුබ්බුළූපමා
මරීචිකූපමා සඤ්ඤා—සංඛාරා කදලූපමා
මායූපමං ච විඤ්ඤාණං—දෙසිතාදිච්චබන්ධුනා"

යනුහෙයින් රූපස්කන්ධය පෙනපිඩකට බඳු උපමාඇත්තේය; වෙදනාස්කන්ධය දියබුබුලකට බඳු උපමා ඇත්තේය; සංඥාස්කන්ධය, මහඅව්වෙහි පෙනෙන මිරිඟුදියට බඳු උපමා ඇත්තේය; සංස්කාර ස්කන්ධය කෙසෙල්කඳට බඳු උපමාඇත්තේය; විඥාන ස්කන්ධය ඉන්ද්‍රජාලයකට බඳු උපමා ඇත්තේයි.

රූපස්කන්ධය' පෙනපිඩක් වැනිවූයේ කෙසේදයත්? යම්සේ පෙනපිඩෙහි කිසි සාරත්වයක් නැත්තේද එයින් පාත්‍රයක්හෝ තළ තැටියක් හෝ විත්සැළි ආදී කිසිදෙයක් හෝ කරම්හයි ඇරගත

---

අහිරිකයද; අනොත්තප්පං, අනපත්‍රපාවද; විචිකිච්ඡිතමෙවච, විචිකිච්ඡාවද;

20 මානො, මානයද; ඉස්සාච, ඊර්ෂ්‍යාවද; මච්ඡෙරංච, මාත්සර්යයද කුක්කුච්චං, කුකූසද; ථිනමිද්ධකං, ථිනයමිද්ධය යනදෙකද; එතානි පඤ්ඤාස, මේ පනස්ධර්මයෝ; ඉති, මෙසේ; සඞ්ඛාරක්ඛන්ධ සඤ්ඤිතා, සංස්කාරස්කන්ධයයි දන්නාලදී.

නොහැක්කේද ගතත් එබඳුවැඩක් සිඹනොකොට බිඳීයන්නේද
එමෙන් රූපස්කන්ධයද නිත්‍යයයි කියාවත් ධ්‍රැවයයි කියාවත් මමය
මාගේයයි කියාවත් නුවණින් සිතාගත නොහැක්කේවේ—තවද
යම්සේ පෙනපිඩ සිදුරුසිදුරුව නොයෙක්සන්ධි එක්ව බොහෝ
දියබරණ ඇටමැඩි සොඬයින් ආදීවූ නොයෙක් ප්‍රාණීන් ලගිනා
තැන් වේද-එපරිද්දෙන් රූපස්කන්ධයද මුඛ නාසිකාදිකුඩාමහත්
සිදුරුහා නොයෙක් ඇට නහර සන්ධි ගැළපී තකොකාටකය, ගඬු
පපාදය, තාලගීරකය, සූචිමුඛය පටතන්තුසූත්‍රය, යනාදීවූ අසූකු
ලයක පණුවන්ට ලග්න ගේත්වේ; දරුවදන ගෙයක්වේ. නාන
ගෙයත්වේ; ගිලාන සාලාවත්වේ; ශම්ශානයත් වේ-තවදයම්සේ
පෙනපිඩ ආදියෙහිඩෙබරගෙඩි පමණ ඇතිව අනුක්‍රමයෙන්ගඞ්ගා
වජීත සමුද්‍රාදියෙහි පර්වතකූට පමණමහත්වේද-එපරිද්දෙන්රූප
ස්කන්ධයද පළමුවෙන් මාතෘකුක්ෂියෙහි හිමාලයවනයෙහි හුන
පුපුළු නම් ප්‍රාණියක්හුගේ උදරරෝමයක් ප්‍රසන්න තලතෙලක
ගලා සත්වටක් ගැසූතල සත්වෙනි වාරයෙහි රෝමාග්‍රයෙහි සිටි
තෙල්බිඳුපමණවූ කලලරූපයෙක් ඇතිවේ; ඒ කලලරූපයෙහි
ප්‍රතිසන්ධිචිත්තය හටගණී; මෙසේ හටගත් ප්‍රතිසන්ධිචිත්තයට අන
තුරුව භවාඞ්ගසිත් තුදුසෙක් පහළවේ—ඊට අනතුරුව මනෝ
වාරාවජීනය පහළවේ. ඊටඅනතුරුව සතොනාෂඋපදවමින් ආතම්
ග්‍රහණය කෙරෙමින් ලෝභසම්ප්‍රයුක්ත සිත් පහළවේ—මෙසේ
ඇතිවූ පහන්තලතෙලිත්තක් වැනි ඒ පූර්වෝක්තවූ කලලරූපය
ක්‍රමයෙන් වැඩී සතියක් ගියකල්හි මස්දෙවි දියත්තක් වැනි අර්
බුදාවස්ථාවට පැමිණේ, දෙසතියක් ගියකල්හි අර්බුදාවස්ථායෙන්
පෙරලී බොල්කොට පිසූලතුදියත්තක් වැනි පෙශිඅවස්ථාවට
පැමිණේ, තුන්සතියක් ගියකල්හි මේ පෙශිඅවස්ථාව පෙරලී මූරු
තමල් කැකුලක්වැනි ඝනඅවස්ථාවට පැමිණේ, සිව්සතියක් ගිය
කල්හි සේදූ මස්කැටියෙක්හි නැගි පස්පොළක්මෙන් දෙඅත දෙ
පය ඉස බෙරී ප්‍රශාඛාවස්ථාවට පැමිණේ, ඉක්බිති පස්වැනිසති
යෙහි පටන් එකොළොස්වන සතිය දක්වා මෙදෑතුරේ අතුල්
පතුල් ඇඟිලි ඇස් මුව කන් නාසා මූත්‍රමාගී වර්චස්මාගී ආදියද
ඉතාසූක්ෂමවූ ඇටද ඉසකෙස්ද වෙරලොම්ද හටගෙණ ක්‍රමයෙන්
වැඩී සම්පූර්ණව බඩයක් පමණවේ. ගොමහිෂහස්ත්‍යශ්වාදීන්ගේ
ශරීර වශයෙන් පර්වතකූටප්‍රමාණවේ, මහමුහුද මස්කැස්බන්ගේ
වශයෙන් නොයෙක්සියගණන් යොදුන් පමණත්වේ-තවද යම්
සේ පෙනපිඩ හටගත් කෙණෙහිත් නැසෙන්නේද; මදක්තැන්
ගොසිනුත් නැසෙන්නේද, මුහුදට ගියකල ඒ කානනයෙන්ම
නැසෙයන්නේද, එමෙන් "රූපස්කන්ධය" කලල අව

ස්ථායෙහිත් නැසෙන්නේය, අර්බුදාවස්ථායෙහිත් නැසෙන්නේය, පෙශිඅවස්ථායෙහිත් නැසෙන්නේය, ඝනාවස්ථායෙහිත් නැසෙන්නේය, ප්‍රශාඛාදීඅවස්ථාවලත් නැසෙන්නේය, මවුකුසින් බිහිවූකලත් නැසෙන්නේය, මන්දදශකයෙහිත් නැසෙන්නේය, ක්‍රීඩාදශකයෙහිත් නැසෙන්නෙය, වර්ණදශකයෙහිත් නැසෙන්නේය, බලදශකයෙහිත් නැසෙන්නේය; ප්‍රඥාදශකයෙහිත් නැසෙන්නේය, හායනදසකයෙහිත් නැසෙන්නේය, ප්‍රාග්භාර දශකයෙහිත් නැසෙන්නේය; ප්‍රවඞ්ක දශකයෙහිත් නැසෙන්නේය; මොමූහ දශකයෙහිත් නැසෙන්නේය, ශයනදශකයෙහිත්නැසෙන්නේය, මේඅතර නොනැසිසිටියේ නමුත් ශතායුෂ්කයන්ගේ රූපය අවුරුදු සියක්පිරුණුකල ඒකාන්තයෙන් බිඳී මරුමුඛයට පැමිණ සුණු විසුණුවේ- එහෙයින් බුදුහු "රූපස්කන්ධය" පෙනපිඬකට බඳු උපමා ඇත්තේයයි වදාළසේක.

"වෙදනාස්කන්ධය,' දියබුබුලක් බඳුවූයේ කෙසේද? යම්සේ දියබුබුල කිසි සාරත්වයක් නැත්තේද දුර්වලද ඇරගත නොහැක්කේද එයින් භාජනයක් හෝ ආසනයක් හෝ අඟුලිමුද්‍රිකාවක් හෝ කර්ණාභූෂණයක් හෝ කොටගත නොහැක්කේද-එමෙන් වෙදනාවද අසාරය දුර්වලය. නිත්‍යය ධ්‍රැවයයි සිතාගත නොහැක්කේවේ; ගත්නමුත් එලෙස ස්ථිරවනොසිටි—තවද යම්සේ ඒ ඒ දියබිඳුවෙන් නැංගාවූ බුබුල එතනම නැසෙන්නේද බොහෝ කලක් සිටින්නේ නොවේද, එපරිද්දෙන් එක අසුරුසණක් පමණකල්හි නොයෙක්කෙළ ලක්ෂගණන් සුඛදුඃඛොපෙක්ෂා වෙදනා පහළව නැසෙන්නේවෙයි—තවද යම්සේ දියබුබුල දියපිටනැගී බුලිමල දියබිඳුදියරොන් එකුතැන්කොට, දූවාණ කරඬුපියනක් මෙන් වටකොට, ගන්නා වාශුයයි, යන කාරණසතරකින් ඇතිවේද, එපරිද්දෙන් වෙදනාවද චක්ෂුඃප්‍රසාදාදී වස්තුවය, රූපාදි ආලම්බනය, ලොභාදි කෙලශමලය, චක්ෂුඃස්පර්ශාදි ස්පර්ශසට්ටනය, යන සතර කාරණයකින් පහළවේ—එහෙයින් බුදුහු 'වෙදනාස්කන්ධය, දිය බුබුලක් හා සදෘශ්‍යයයි වදාළසේක.

'සංඥාස්කන්ධය'මිරිඟුදියහා සදෘශවූයේ කෙසේද? යම්සේ ග්‍රීෂ්ම කාලයෙහි මහඅව්වෙහි පෙනෙන මිරිඟුදිය චචලව මහවතුරේරළ හසන්නාසේ පෙනේද එමෙන් නිල්පැහැය රත්පැහැය [illegible]නාදීන්

සලකා ගන්නා සංඥව අනුභවපිණිස පොපි ගණී—තවද යම්සේ මිරිඟුදිය—පිරුණු පොකුණක්මෙන් පෙනී පිපාසාවෙන් පීඩිතවූ මෘගයන් වඤ්චාකෙරේද එමෙන් සංඥවද මේ නිල්වන්රූපය,මේ රන්වන්රූපය මේ සම්වන්රූපය. සුභය;මනාපය, සැපය, නිත්‍ය යයි ප්‍රශංසාකරවා සත්‍වයන් වචාකෙරේ—එහෙයින් බුදුහු සංඥ සකන්ධය' මිරිඟුදිය හා සමානයයි වදාළසේකි.

'සංස්කාරස්කන්ධය' අසාරනිස්සාරාර්ථයෙන් කදලිස්කන්ධයක් හා සදෘශවේ—යම්සේ කෙසෙල්කඳින් කිසිවක්ගෙණ ගෝනැස් පැලහන්පට්ටිකා ආදිවූකිසි ගෘහකර්මාන්තාදියක් කොටගත නොහැකිවේද, ගත්තමුත් සථිරව නොසිටීද, එපරිද්දෙන් සංස්කාරයෝද නිත්‍යය ධ්‍රැවය මමය මාගේයයි ග්‍රහණය කටයුත්තාහු නොවෙති. තවද යම්සේ කදලීස්කන්ධය බොහෝ පතුරුවැටී සමූහවේද, එපරිද්දෙන් සංස්කාරස්කන්ධයද බොහෝ ධර්මරාශියක්වේ =තවද යම්සේ කද[illegible] පිටපතුරු වෙනපැහැයෙක් වේද ඇතුළ පතුරු ක්‍රමයෙන් වෙ[illegible] වෙන පැහැ වෙන වෙන ආකාර ඇතිවේද එපරිද්දෙන් ස්පර්ශාදි නානා ස්වභාවඇති සම පනස් ධර්මයෝ එක්ව 'සංස්කාරස්කන්ධ'නම් වෙත්-එහෙයින්බුදුහු 'සංස්කාරස්කන්ධය' කදලීස්කන්ධයක් හා සදෘශයයි වදාළසේකි.

'විඥානස්කන්ධය, අසාරාර්ථයෙන් ඉන්ද්‍රජාලයක් වැනිවේ.හේතෙසේද? යම්සේ ඉන්ද්‍රජාලය මදකලක් පැවත ඉතාසීඝ්‍රව නැතිවේද ඊටවඩා ශතසහස්‍රගුණයෙන් චිත්තයම ස්වල්පකාලයක් පැවත නැසෙන්නේ වේ—එකමචිත්තයෙන් පුරුෂයා ආයේය, ගියේය, සිටියේය, උන්නේයයි, වැටහෙන්නේය, එනකල්හි වෙනසිතෙක් වේ; සිටිනාකල්හි වෙනසිතෙක්වේ;හිඳිනාකල් ආදීයෙහිද වෙන වෙන සිත් වේ;—තවදයම්සේ ඉන්ද්‍රජාලය මහජනයා වංචාකොට කැටකැබිලිති ආදී කිසිවක් රන් රිදී මිණිමුතුයයි ග්‍රහණයකරවාද එපරිද්දෙන් මේ'විඥානස්කන්ධ'නම්වූ චිත්තයම එකමචිත්තයෙන් ආවාක්මෙන් ගියාක්මෙන් සිටියාක්මෙන් උන්නාක්මෙන් සත්‍වයන් වඤ්චාකෙරේ—එහෙයින් බුදුහු 'විඥානස්කන්ධය' ඉන්ද්‍රජාලය කටබඳු උපමා ඇත්තේයයි වදාළසේකි; තවද.

(21) "රාශිවත් සාර්ථවච්චෛව-චක්‍රවන්නමුච්චවත් තථා
සකන්ධෙසු පඤ්චසු ප්‍රාඥෛ-රාත්මශබ්දඃ ප්‍රගීයතෙ"

කියා "ෂඩ්දර්ශන සඞ්ග්‍රහ" නම්වූ බෞද්ධතර්කයෙහි කීහෙයින් රාශිවත්, ධාන්‍යරාශිය යවරාශිය මුද්ගරාශියයි කීකල ධාන්‍ය යව මුද්ගයන් හැර අන්රාශියක් නැත්තාක්මෙන්ද, සාර්ථවත්, ජඞ්ඝසාර්ථ ශකටසාර්ථයයි කීකල ගැල් ගොන් බඩුපොදි වණිග්ජනයා හැර අනික් සාර්ථයයි යන දෙයක් නැත්තාක්මෙන්ද; චක්‍රවත්. අලාතචක්‍රය රථචක්‍රය කුලාලචක්‍රයයි කීකල මණ්ඩලාකාරයෙන් වළල්ලක් මෙන් වට ගිනිපෙනහෙල්ලරියක් පෝරුකඩ විනා අන්චක්‍රයයි යන දෙයක් නැත්තාක්මෙන්ද; මුෂ්ටිවත් මිටයයිකී කල අකුළුවාගත් ඇඟිලිපුසට මිටයයි යන ව්‍යවහාරයමුත් ඇඟිලි හැර මිටයයි යන අන්වස්තුවක් නැත්තාක්මෙන්ද; සකන්ධෙෂු පඤ්චසු, රූප වේදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණය යන පඤ්චස්කන්ධයෙහි; ආත්මශබ්දඃ, ආත්මය යන ව්‍යවහාර ශබ්දමාත්‍රයෙක්; ප්‍රාඥෛඃ, නුවනැත්තන්විසින්, ප්‍රගීයතෙ, කියනුලැබේ; කෙවත් ව්‍යවහාරකරණුලැබේ-එයින්මෙසේ ස්වභාවධර්මරාශි මාත්‍රවූ ආත්ම ආත්මීයශූන්‍යවූ සකන්ධපඤ්චකයෙහි මමය මාගේය යන විපරීත ග්‍රහණය නොකටයුත්තේයි—මේ සංසාරචක්‍රය ප්‍රතීත්‍යසමුත්පාද ක්‍රමයෙන් මෙසේ දතයුතු.

"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං විඤ්ඤාණපච්චයා නාමරූපං නාමරූපපච්චයා සළායතනං සළායතනපච්චයා ඵස්සො ඵස්සපච්චයා වෙදනා වෙදනාපච්චයා තණ්හා තණ්හාපච්චයා උපාදානං උපාදානපච්චයා භවො භවපච්චයා ජාති ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති"—අවින්දියං වින්දතීති අවිජ්ජා' නොවින්දයුතුවූ කාය දුශ්චරිතාදිය විඳීනුයි අවිද්‍යානම්වේ; වින්දියං නවින්දතීති අවිජ්ජා, පැමිණිය යුතුවූ කායසුචරිතාදියට නොපැමිණේනුයි අවිද්‍යානම්වේ; ඛන්ධානං රාසට්ඨං ආයතනානං ආයතනට්ඨං ධාතූනං සුඤ්ඤතට්ඨං ඉන්ද්‍රියානං අධිපතෙය්‍යට්ඨං සච්චානං තථට්ඨං අවිදිතං කරොතීති අවිජ්ජා රූපාදිපඤ්චස්කන්ධයන්ගේ රාශ්‍යර්ථයද, චක්ඛායතනාදිෂඩායතන

(21) ප්‍රාඥෛඃ, පණ්ඩිතයන්විසින්; පඤ්චසුසකන්ධෙෂු, පඤ්චස්කන්ධයන්කෙරෙහි; රාශිවත්, ධාන්‍යාදිරාශියක්මෙන්ද; සාර්ථවච්චෛව ජඞ්ඝසාර්ථාදිසාර්ථයක්මෙන්ද; චක්‍රවත්, රථචක්‍රාදිචක්‍රයක්මෙන්ද; තථා, එසේම; මුෂ්ටිවත්, හස්තමුෂ්ටියක්මෙන්ද; ආත්මශබ්දඃ, ආත්මයයිව්‍යවහාරශබ්දය; ප්‍රගීයතෙ, කියනුලැබේ.

යන්ගේ චක්ෂුර්විඥානාදීන් පවත්නා ස්වභාවයද, චක්ඛුධාත්වාදි අෂ්ටාදශ ධාතූන්ගේ ධ්‍රැවසුභසුඛාදි ශූන්‍ය බවද, චක්ෂුරාදි ෂඩෙන්ද්‍රියයන්ගේ ආධිපත්‍යයද, දුක්ඛාදිචතුස්සත්‍යයන්ගේ තථාස්වභාවයද,ඇස වසා බැඳිකඩක්මෙන් සම්මෝහභාවයෙන් අප්‍රකටකෙරේනුයි අවිද්‍යානම්වේ—අවිජ්ජාපච්චයා, මෙබඳුඅවිද්‍යාප්‍රත්‍යයෙන් හෙවත් නුනුවණයයිකියනලද අවිද්‍යාව කාරණකොටගෙණ'සඞ්ඛාරා,පුඤ්ඤාභිසඞ්ඛාරය අපුඤ්ඤාභිසඞ්ඛාරය ආනෙඤ්ජාභිසඞ්ඛාරයයන ලෞකික කුශලාකුශල චේතනාවෝ; සම්භවන්ති, වෙත්; සඞ්ඛාරපච්චයා, මේ ත්‍රිවිධවූ සංස්කාර ප්‍රත්‍යයෙන්; විඤ්ඤාණං, ප්‍රතිසන්ධිවිඥානය හෙවත් ප්‍රතිසන්ධිවශයෙන් එකුන්විසිවැදෑරුම්වූ ප්‍රවෘත්තිවශයෙන් දෙතිස් වැදෑරුම්වූ විපාකවිඤ්ඤාණය; සම්භවති, ලැබේ විඤ්ඤාණපච්චයා මේ යථොක්ත විපාකවිඥාන ප්‍රත්‍යයෙන්; නාමරූපං, වේදනාදි ස්කන්ධත්‍රය සඞ්ඛ්‍යාතවූ නාමයද භූතො පාදාය භෙදවශයෙන් විප්‍රකාරවූ කර්මජරූපයද යන නාමරූපදෙක, සම්භවන්ති, වෙත්; නාමරූපපච්චයා, නාමරූපප්‍රත්‍යයෙන්; සළායතනං; චක්ඛායතනය සෝතායතනය ඝානායතනය ජිව්හායතනය කායායතනය මනායතනය යන ෂඩ්විධවූ අධ්‍යාත්මිකායතනය; සම්භවති, වේ; සළායතනපච්චයා, ෂඩායතනප්‍රත්‍යයෙන්; ඵස්සො, "චක්ඛුසම්ඵස්සො සෝතසම්ඵස්සො ඝානසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො

මනොසම්ඵස්සො,,යන ෂඩ්වාරිකවූ ස්පර්ශ; සම්භවති, වේ; ඵස්සපච්චයා, ස්පර්ශප්‍රත්‍යයෙන්; වේදනා, "චක්ඛුසම්ඵස්සජාවෙදනා සෝතසම්ඵස්සජාවේදනා ඝානසම්ඵස්සජාවේදනා ජිව්හා සම්ඵස්සජාවෙදනා කායසම්ඵස්සජාවෙදනා මනොසම්ඵස්සජාවෙදනා" යන ෂඩ්විධවූ වේදනාව නොහොත් සුඛදුඃඛොපෙක්ෂාවශයෙන් ත්‍රිවිධවූ වේදනාව; සම්භවති, වේ; වේදනා පච්චයා, මේ යථොක්තවූ වේදනාප්‍රත්‍යයෙන්;තණ්හා,"රූපතණ්හාසද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා" යන ෂඩ්විධවූ තෘෂ්ණාව නොහොත් කාමතෘෂ්ණාදිවශයෙන් ත්‍රිවිධවූ ආධ්‍යාත්මික බාහ්‍ය අතීතානාගත වර්තමානකාල ෂඩාලම්බන භෙදයෙන් අෂ්ටෝත්තරශත ප්‍රභෙදවූ තෘෂ්ණාව; සම්භවති, වේ; තණ්හාපච්චයා, තෘෂ්ණාප්‍රත්‍යයෙන්; උපාදානං, කාමුපාදානය දිට්ඨුපාදානය සීලබ්බතුපාදානය අත්තවාදුපාදානය යන චතුර්විධොපාදානය, සම්භවති, වේ; ( උපාදානය නම් කිසිවෙකු විසින් කියා හරවාගත නොහැකිලෙස

දැඩිකොට කුම්භීල ග්‍රාහයක්මෙන් අරමුණුගෙණ පවත්නාවූ තෘෂ්ණාවයි) උපාදාන පච්චයා; උපාදාන ප්‍රත්‍යයෙන්; භවො, කාමාවචර රූපාවචර අරූපාවචර වශයෙන් එකුන්තිස් වැදෑරුම්වූ කර්මභවයද; කාමභවය, රූපභවය, අරූපභවය, සඤ්ඤීභවය, අසඤ්ඤීභවය, නෙවසඤ්ඤී නාසඤ්ඤීභවය, එකවොකාරභවය, චතුවොකාරභවය, පඤ්චවොකාරභවය, යන නවවිධවූ උප්පත්තිභවයද; සම්භවති, වේ; භවපච්චයා, මේ විවිධවූ භවයන් අතුරෙන් කර්මභව ප්‍රත්‍යයෙන්, ජාති, ඒ ඒ භවයෙහි ස්කන්ධයන්ගේ පහලවීම්යයි කියනලද සම්භොත්පත්තිය; සම්භවති, වේ; ජාතිපච්චයා, උක්තප්‍රකාර ජාතිප්‍රත්‍යයෙන්; ජරා, ස්කන්ධයන්ගේ මිහිකිරීමයයි කියනලද ජරාවද; මරණං, ස්කන්ධයන්ගේ බිඳීමයයි කියනලද මරණයද; සොක, මට යමක් පලමුවිද ඒ මටදැන් නැතිවීයයි අභ්‍යන්තර චින්තාවශයෙන් උපදනාවූ ලක්ෂණ ඇති ශොකයද; පරිදෙව, තන්නිශ්‍රිත ආලාප සඞ්ඛ්‍යාතවූ පරිදෙවයද; දුක්ඛ, කාය ප්‍රති පීඩන ලක්ෂණඇති දුඃඛයද; දොමනස්ස, මනො විඝාත ලක්ෂණඇති දෞර්මනස්‍යයද; උපායාසා, විෂාදලක්ෂණ ඇති උපායාසයද යන මොහු; සම්භවන්ති, වෙත්; එවං, මේ යථොක්තවූ ප්‍රත්‍ය පරම්පරා වශයෙන්ම; කෙවලස්ස, සුඛාදීන් අමිශ්‍රවූ නොහොත් සියලු; එතස්සදුක්ඛක්ඛන්ධස්ස, මේ ත්‍රෛභූමක වෘත්තසඞ්ඛ්‍යාතවූ දුඃඛරාශිහුගේ; සමුදයො හොති, උත්පත්තිය වේ. ඊශ්වර නිර්මාණාදි වශයෙන් උත්පත්තියක් නොවේ.

ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි කී මේ සංසාරචක්‍රයෙහි අවිද්‍යාසංස්කාරවය එක්සංක්ෂෙපයෙකි. විඤ්ඤාණ, නාමරූප, ෂඩායතන, ස්පර්ශ වෙදනා, පස එක් සංක්ෂෙපයෙකි. තෘෂ්ණා, උපාදාන, භව, තුන එක් සඞ්ක්ෂෙපයකි. ජාති, ජරා, මරණ, තුණ එක්සංක්ෂෙපයෙකි. මේ සතර සංක්ෂෙපයෝ කාලවිභාගයෙන් අතීතහෙතුය, එතරහි විපාකය, එතරහිහෙතුය, ආයති විපාකයයි සතරදෙනෙක් වෙත්.

මේ සතරසංක්ෂෙපයන් අතුරෙන් අවිද්‍යාසංස්කාරයයි යන පූර්වසංක්ෂෙපය 'අතීත අධ්ව' නම්වේ, විඤ්ඤාණ නාමරූප ෂඩායතන ස්පර්ශ වෙදනා සංක්ෂෙපය, තෘෂ්ණා උපාදාන භවසංක්ෂෙපය, යන මධ්‍යයෙහිවූ සංක්ෂෙපවය වර්තමාන, අධ්ව නම්වේ; ජාති ජරා මරණ යන පශ්චිමවූ සංක්ෂෙපය 'අනාගත අධ්ව, නම්වේ "අවිද්‍යාසංස්කාර තෘෂ්ණා උපාදාන භව" යන මේ ධර්මපඤ්චකය

අතීතකාලයෙහි කර්‍ම වෘත්තයයි, "විඤ්ඤාණ නාමරූප ෂඩායතන ස්පර්‍ශ වෙදනා" යන මේ ධර්‍ම පඤ්චකය එතරහි විපාකවෘත්තයයි, "තෘෂ්ණොපාදාන භව අවිද්‍යා සංස්කාර" යන මේ ධර්‍මපඤ්චකය එතරහි කර්‍මවෘත්තයයි. ජාතිජරාමරණයන් ග්‍රහණයකරණලද "විඤ්ඤාණ නාමරූප ෂඩායතන ස්පර්‍ශ වෙදනා" යන මේ ධර්‍ම පඤ්චකය අනාගතභවයෙහි විපාකවෘත්තයයි. මෙසේ වෘත්තවශයෙන් කියනලද ධර්‍මයෝ,

"අතීතෙ හෙතුයො පඤ්ච-ඉදානි ඵලපඤ්චකං
ඉදානි හෙතුයො පඤ්ච-ආයතිං ඵලපඤ්චකං".

යනාදීන් දක්වනලද අතීතහෙතු පඤ්චකාදි ආකාරවශයෙන් කොට්ඨාසවශයෙන් විසිවැදෑරුම්වෙත්; මේ විංශති ආකාරයන් අතුරෙන් සංස්කාර විඥාන දෙදෙනාගේ අතුර එක්සන්ධියකි; වෙදනා තෘෂ්ණා දෙදෙනාගේ අතුර එක්සන්ධියකි; භව ජාති දෙදෙනාගේ අතුර එක්සන්ධියෙකි.

මෙසේ අධ්වත්‍රයක් ඇති ද්වාදශාඞ්ගයක් ඇති විංශත්‍යාකාරයක් ඇති ත්‍රිසන්ධියක් ඇති චතුස්සංක්ෂෙපයක් ඇති වෘත්තත්‍රයක් ඇති මූලද්වයක් ඇති ප්‍රතීත්‍ය සමුත්පාදවශයෙන් කියනලද අවිද්‍යා භව තෘෂ්ණාමය නාභිඇති පුණ්‍යාදි අභිසංස්කාරමය දෑවි ඇති ජරාමරණ නමැති නිම්වළලුඇති ආශ්‍රවසමුදය නමැති අකුරෙකින් විද ත්‍රිභවනමැති රථයෙහි යොදනලද අනාදිකාල ප්‍රවෘත්තවූ සංසාරචක්‍රය භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ,

ශ්‍රීමහාබොධිද්‍රැම මූලයෙහිදී මසැසින් දක්නාමෙන් සර්‍වප්‍රකාරයෙන් නුවණැසින් ප්‍රත්‍යක්ෂකොට දැක ඒ අවිද්‍යාදි ධර්‍මයන් කෙරෙහි කලකිරී ශ්‍රොතාපත්ත්‍යාදි ලොකොත්තරවූ චතුර්විධ මාර්‍ගයෙන් ඔවුන්කෙරෙහි නොඇලී උන්කෙරෙන් මිදෙනු කැමතිසේක් යථොක්තවූ මේ සංසාරචක්‍රයාගේ අරසඞ්ඛ්‍යාත සංස්කාරාදි දෑවින් එම බොධිමූලයෙහිදී සන්නිරුම්භනසන්නිකම්පන කෘත්‍යඇති වීර්‍ය නමැති පාදයෙන් සීල නැමති පෘථිවියෙහි සම්පාදන වශයෙන් පිහිටා අනවද්‍ය ධර්‍මාදන සාධන ශ්‍රද්ධා නමැති හස්තයෙන් කාමාවචර කර්‍මාදි ප්‍රභෙද සියලු කර්‍මයන් ක්ෂයකරන්නාවූ සමාධි ශිලායෙහි මුවහත් තබනලද මාර්‍ගඥාන නැමති පරශුවගෙණ විහත විධ්වස්ත භාවයට පැමිණවූසේක්; කපා සුණුවිසුණු කළසේක්; එහෙයින්

බුදුහු“අරාණං හතත්වාදහීත්” යනවාක්‍යයෙහි අරශබ්දෙප පදවූ යථොක්ත ‘හන-හිංසායාම්, යන ධාතුයෙනුත් “අහීත්” නම් වන සේකි.

(22) “අරා සංසාරචක්කස්ස-හතා ඤාණාසිනා යතො
ලොකනාථෙන තෙනෙස-අරහන්ති පවුච්චති”

යනු එහෙයින්ම කියනලදී

තවද බුදුහුචීවරාදිචතුර්විධප්‍රත්‍යයටද පූජාවිශෙෂයටද සුදුසු වනසේකි; එහෙයින් බුදුන්ලොවඋපන්කල්හියම්කිසිමහානුභාව සම්පන්නවූ දිව්‍යමනුෂ්‍යකෙනෙක් ඇද්ද ඔහුබුදුන්හැර අන්තැන කට පූජාසත්කාර නොකෙරෙත්-එසේමැයි; සහම්පතීනම් මහා බ්‍රහ්මතෙම බුදුන්ටමහමෙරසා රුවන්දමකින්පූජාකෙළේය,සෙසු දෙවියෝද කොශල බිම්බිසාරාදි මනුෂ්‍යයෝද තමතමන්ගේ ශක්තිවූපරිද්දෙන් පූජාකළාහුය, පිරිනිවි බුදුන් උදෙසා ධර්මාශොක මහරජ්ජුරුවෝද සයානුකෙලක්ධනවියදම්කොට සමස්තජම්බුද්වීප යෙහි සුවාසූදහසක් විහාරකරවා පූජාකෙළේයි;මෙසේබුදුහුදිව්‍ය බ්‍රහ්මාදීන්විසින් කරණුලබන උදාරතර ප්‍රත්‍යයපූජාවට හා ප්‍රතිපත්තිපූජාවට යොග්‍යහෙයින් “ප්‍රත්‍යයාදීනාමහීත්වාදහීත්” යන වාක්‍යයෙහි‘අහී-මහ-පූජයාම්’යනධාතුහුකෙරෙන්අහීවිශිෂ්ටකතීයෙහි නිෂ්පන්න ශත්‍රන්තනාමවශයෙනුත් “අහීත්”නම්වනසේකි.

23 “පූජාවිසෙසං සහපච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාම මෙතං”

යනු එහෙයින්ම කියනලදී-

---

(22) ලොකනාථෙන, සර්වඥයන්වහන්සේවිසින්;සංසාරචක්කස්ස, සංසාරචක්‍රයාගේ; අරා, අරසඞ්ඛ්‍යාතසංස්කාරයෝ; යතො, යම්හෙයකින්; ඤාණාසිනා, ප්‍රඥානැමතිඛඩ්ගයෙන්; හතා, (ඡේදනයකිරීමෙන්) නසනලද්දාහුද; තෙන, ඒකාරණයෙන්; එසො, මේ සර්වඥතෙම; අරහන්ති, අහීත්යයි; පවුච්චති, කියනුලැබේ.

---

(23) යස්මා, යම්හෙයකින්; අයංලොකනාථො,මේසර්වඥතෙම; සහපච්චයෙහි,චීවරාදිප්‍රත්‍යයසමග; පූජාවිසෙසං,පූජාවිශෙෂයට; අරහති, සුදුසුවනසේක්ද; තස්මා, එහෙයින්; ජිනො,සර්වඥතෙම; ලොකෙ, ලොකයෙහි; අත්ථානුරූපං, අර්ථානුකූලවූ; අරහංඉති අහීත්යයි; (කියනලද) එතංනාමං, මේනාමයට; අරහති, සුදුසු වනසේකි.

තවද බුදුහු ලොභද්වෙෂාදි පාපහෙතූන් සුප්‍රහීණ බැවින් රහසත් පව් නොකරණසේකි; යම්සේ ලොකයෙහි අපි පණ්ඩිතයම්හයි යන මන්ඇති යම්කිසි අඥානකෙනෙක් අකීර්තිභයින් රහසපව් කෙරෙද්ද එපරිද්දෙන් බුදුහු කිසිකලෙකත් රහසත් පව් නොකරණසේකි; එහෙයින් "පාපකරණෙ රහාභාවාදහීත්"යන වාක්‍යයෙහි නෛරුක්තික විධියෙනුත් "අහීත්" නම්වනසේකි.

(24) "යස්මා නත්ථි රහො නාම–පාපකම්මෙසු තාදිනො
රහාභාවෙන තෙනෙස–අරහං ඉති විස්සුතො

යනු එහෙයින්ම කියනලදී.

මේ අටුවායෙහි කී අර්ථ පස්පනතියයි—තවද,

(25) "ආරකා මන්දබුද්ධීනං–ආරකා ච විජානතං
රහානං සුප්පහීණත්තා–විදූන මරහෙය්‍යතො
භවෙසු ච රහාභාවා–පාසංසා අරහං ජිනො"

යනුහෙයින් බුදුහු අභාවිතකාය ශීලචිත්ත ප්‍රඥාඇති අප්‍රහීණ රාගද්වෙෂමොහයෙන් යුක්තමිථ්‍යාප්‍රතිපන්න හීනාධිමුක්තිකවූඅසජ්ජනයන් කෙරෙන් ඉතාදුරුවූ හෙයිනුත් "අහීත්" නම් වනසේකි.

(26) සම්මා නප්පටිපජ්ජන්ති–යෙ නිහීනාසයා නරා
ආරකා තෙහි භගවා–දූරෙ තෙනා රහං මතො

යනු එහෙයින්ම කියනලදී–

තවද බුදුහුභාවිතකාය ශීලචිත්ත ප්‍රඥාඇතිප්‍රහීණ රාගද්වෙෂ මොහයෙන් යුක්ත ප්‍රණීතාධිමුක්තිකවූ සාධුජනයන්ට ආසන්න හෙයිනුත් "අහීත්" නම් වනසේකි,

(27) යෙ සම්මා පටිපජ්ජන්ති–සුප්පණීතාධිමුත්තිකා
ආරකා තෙහි ආසන්නා–තෙනාපි අරහං ජිනො

යනු එහෙයින්ම කියනලදී–

---

(24) තාදිනො, සර්වඥයන්වහන්සේගේ; යස්මා, යම්හෙයකින් පාපකම්මෙසු, පාපක්‍රියාවන්හී; රහොනාම, රහසෙක් නම්; නත්ථි නැත්තේද; තෙනරහාභාවෙන, (පව්කිරීමෙහි) ඒ රහස නැති බැවින්; එසො, මේසර්වඥතෙම; අරහංඉති, අර්හත්යයි; විස්සුතො, ප්‍රසිද්ධවූසේක.

තවද බුදුහු ආත්මහිත පරහිත පරිපූරණයපිණිස සම්‍යක් ප්‍රතිපන්න සාධුජනයන්විසින් ආසන්නභාවයෙන් එකාන්තයෙන් රහිතව්‍ය පරිත්‍යජ්‍ය ප්‍රහාතව්‍යාර්ථයෙන් රහසඞ්ඛ්‍යාතවූ රාගාදි පාපධර්මයන් බොධිමූලයෙහිදීම ප්‍රහීණ කළබැවින් "අර්හත්" නම් වනසේකි. මේ අර්ථපක්ෂයෙහි "තස්සන්ති එතස්ස රහාති අරහො"යි කියයුතුහෙනහි ඔකාරයට සානුස්වාර අකාරයක් කිරීමෙන් 'අරහං' යනු සිද්ධයි.

28 "පාපධම්මා රහා නාම-සාධූහි රහිතබ්බතො
තෙසං සුට්ඨු පහීණත්තා-භගවා අරහං මතො"

යනු එහෙයින්ම කියනලදී—

සර්වප්‍රකාරයෙන් පරිඥාතස්කන්ධයන් ඇති ප්‍රහීණ ක්ලේශවූ භාවිතමාර්ගී සාක්ෂාත්කෘත නිරොධඇති ක්ෂීණාශ්‍රව ශෛක්ෂ කල්‍යාණ පෘථග්ජනාඛ්‍ය සුප්‍රතිපන්න පුරුෂවිශෙෂයන් විසින් සෙවනය කටයුතු බැවිනුත් "අර්හත්" නම් වනසේකි,

---

(25) මන්දබුද්ධීනං, මඳනුවනඇත්තන්ට; ආරකා, දුරුබැවින්ද; විජානතං, ප්‍රඥාවන්තයන්ට; ආරකාච, සමීපබැවින්ද; රහානං, රහසඞ්ඛ්‍යාතපාපධර්මයන්; සුප්පහීණත්තා, මොනවටප්‍රහීණකළ බැවින්ද; විදූනං, පණ්ඩිතයන්විසින්; අරහෙය්‍යතො, පිදියයුතු බැවින්ද; භවෙසුච, සංසාරයෙහිත්; රහාභාවා, ගමන්නැතිබැවින්ද, පාසංසා, (දිව්‍යබ්‍රහ්මාදීන්විසින්)ප්‍රශංසාකටයුතුබැවින්ද; ජිනො, සර්වඥතෙම; අරහං, අර්හත්නම්වනසේකි.

(26) නිහීනාසයා, ලාමකඅදහස්ඇත්තාවූ; යෙනරා, යම්මනුෂ්‍යයෝ; සම්මා, මනාකොට; නප්පටිපජ්ජන්ති, නොපිළිපදිත්ද; තෙහි, ඔවුන්කෙරෙන්; භගවා, සර්වඥතෙම; ආරකාදූරෙ, අතිශයින් ඈත්වන්නේය; තෙන, එහෙයින්; අරහංමතො, අර්හත්යයි දන්නාලදී.

(27) සුප්පණීතාධිමුත්තිකා, අතිප්‍රණීතඅධ්‍යාශයවත්වූ; යෙ, යම් ජනකෙනෙක්; සම්මා, මොනවට; පටිපජ්ජන්ති, පිළිපදිද්ද; තෙහි, ඔවුන්කෙරෙන්; ආරකා, ආසන්නො; (සර්වඥතෙම) අතිශයින් ආසන්නයෙහිය; තෙනාපි, එසිනුදු; ජිනො, සර්වඥතෙම; අරහං, අර්හත්නම්වන්නේයි.

(28) සාධූහි, සත්පුරුෂයන්විසින්; රහිතබ්බතො, හැරියයුතු බැවින්; පාපධම්මා, අකුශලධර්මයෝ; රහානාම, රහනම්වෙත්; තෙසං, ඔවුන්; සුට්ඨුපහීණත්තා, මනාකොටප්‍රහීණකළබැවින්; භගවා, භාග්‍යවත්තෙම; අරහංමතො, අර්හත්යයිදන්නාලදී.

29 'යෙ සච්ඡිකතසද්ධම්මා—අරියා සුද්ධගොචරා
න තෙහි රහිතො හොති-නාථො තෙනා රහං මතො'

යනු එහෙයින්ම කියනලදී—

තවත් බුදුහු බෝධිමූලයෙහිදීම කර්මක්ෂයකර ආර්‍යමාර්ගඥානයෙන් සර්වප්‍රකාරයෙන් සසම්භාර කර්මවෘත්තය විධ්වංසනය කළ බැවින් නානාගති භ්‍රමණයයි කියනලද චක්‍රසංඛ්‍යාත සංසාරගමනය නැතිබැවිනුත් 'අර්හත්, නම් වනසේකි.

30 "රහො වා ගමනං යස්ස-සංසාරෙ නත්ථි සබ්බසො
පහීණජාතිමරණො-අරහං සුගතො මතො"

යනු එහෙයින්ම කියනලදී-

අනන්ත ශීලසමාධිප්‍රඥා විමුක්තිවිමුක්තිඥානදර්ශනාදිඅනන්‍ය සාධාරණ යථාභූත ගුණාධිගත සදෙවක ලොකයෙහි සුප්‍රතිෂ්ඨිත වූ ප්‍රශස්තභාවයෙන්දෙවමනුෂ්‍යාදි පණ්ඩිතජනයන්විසින්ප්‍රශංසා කටයුතු බැවිනුත් "අර්හත්" නම් වනසේකි.

31 "ගුණෙහි සදිසො නත්ථි-යස්මා ලොකෙ සදෙවකෙ
තස්මා පාසංසියත්තා පි-අරහං දිපදුත්තමො"

යනු එහෙයින්ම කියනලදී-

මේ ටීකායෙහි ආ අර්ථ සපනතියයි-

---

[29] සච්ඡිකතසද්ධම්මා, ප්‍රත්‍යක්ෂකළසද්ධර්මයඇති; සුද්ධගොචරා, පරිශුද්ධගොචර ඇති; යෙඅරියා, යම්ආර්‍යකෙනෙක්වෙද්ද; තෙහි, ඒ ආර්‍යයන්විසින්; න රහිතො හොති, අත්නොහරිනලද්දේද් වෙයි;(සෙවනයකරණලද්දේයිසේයි)තෙන,ඒකරණකොටගෙණ නාථො, සර්වඥතෙම; අරහංමතො, රහත්යයිදන්නාලදී.

[30] යස්ස, යම්බදු (උත්තම) කෙනෙක්හට; රහොවා, රහ සංඛ්‍යාතකාරණයක්හෝ; සංසාරෙ, භවයෙහි;ගමනංවා,(චුතිප්‍රතිසන්ධිවශයෙන්) ගමනක්හෝ; සබ්බසො, සර්වාකාරයෙන්; නත්ථි, නැද්ද; පහීණජාතිමරණො,ප්‍රහීණවූජාති (ජරා)මරණඇත්තේද; (එහෙයින්) සුගතො, සර්වඥතෙම; අරහංමතො, අර්හත්යයි දන්නාලදී.

[31] යස්මා, යම්හෙයකින්; සදෙවකෙලොකෙ, දෙවියන්සහිත ලොකයෙහි; ගුණෙහි, ගුණයෙන්; සදිසොනත්ථි, සමානයෙක් නැත්තේද; තස්මා, එහෙයින්, පාසංසියත්තාපි, පැසසියයුතුබැවින්ද; දිපදුත්තමො, සර්වඥතෙම; අරහං, අර්හත්වනසේක.

“සම්මාසම්බුද්ධො” යනතන්හි

32 “අනුපගත මතීත මභ්‍යුපෙතං
චරදචරත් ක්ෂය මක්ෂයඤ්ච කෘත්ස්නම්
යත ඉහ සුබුබොධ බොධිමූලෙ
බුධමහිතො භගවාංස්තතස්සබුද්ධඃ”

යතුහෙයින් අවිපරීතකොට පරප්‍රත්‍යයනොවී ස්වලක්ෂණ සාමාන්‍යලක්ෂණවශයෙන් විශිෂ්ටඥානයෙන් දතයුතු චතුස්සත්‍ය ධර්මානුගතවූ භූතභවිෂ්‍යත්වර්තමාන ස්ථාවර ජඞ්ගම නිත්‍යානිත්‍යාදි සකලඥෙයමණ්ඩලය කරතලාමලකක්‍රමයෙන් අවබොධකළබැවින් “දීක්ෂිතො නදදෘක්” යනතන්හිමෙන් අර්ථවිශෙෂාපෙක්ෂාවයෙන් නිරවශෙෂ පර්‍ය්‍යාදානය හෙතුකොටගෙණ “සම්‍යක් බුද්ධවාන්” යන වාක්‍යයෙහි සව්‍යාප්‍යවූද; අව්‍යයොපපද-“බුධ-අවගමනෙ” යන ධාතුහුකෙරෙන් බහුලවිධානයෙන් “ගත්‍යර්ථානාප්‍යාදධාරෙ ච” යන සූත්‍රයෙන් කර්තෘකාරකයෙහි යුක්තප්‍රත්‍යයෙන් නිෂ්පන්න කෘදන්තනාමවශයෙන් බුදුහු “සම්‍යක්සම්බුද්ධ” නම් වනසේක-වැලිත් ‘බුජ්ඣිතා සච්චානීති බුද්ධො, බොධෙතා පජායාති බුද්ධො; සබ්බඤ්ඤුතාය බුද්ධො, සබ්බදස්සාවිතාය බුද්ධො, අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො, විසවිතාය බුද්ධො, ඛීණාසව සඞ්ඛාතෙන බුද්ධො, නිරුපලෙප සඞ්ඛාතෙන බුද්ධො, එකන්තවීතරාගොති බුද්ධො, එකන්ත වීතදොසොති බුද්ධො, එකන්ත වීතමොහොති බුද්ධො, එකන්ත නික්කිලෙසොති බුද්ධො; එකායනමග්ගං ගතොති බුද්ධො, එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති බුද්ධො; අබුද්ධි විහතත්තා බුද්ධිපටිලාභත්තා බුද්ධො” යනාදීන් නිර්දේශ පාඨයෙහි නිර්දිෂ්ටාර්ථ ප්‍රභෙදයෙනුත් “සම්‍යක්සම්බුද්ධ” නම් වනසේකි.

“විජ්ජාචරණසම්පන්නො” යනතන්හි ‘විජ්ජා, නම්

33 “විපස්සනාඤාණ මනොමයිද්ධි
ඉද්ධිප්පභෙදො පිච දිබ්බසොතං
පරස්ස චෙතො පරියාය ඤාණං
පුබ්බෙ නිවාසානුගතඤ්ච ඤාණං.

---

(32, බුධමහිතඃ, නුවණැත්තන්විසින් පූජාකරණලද්දාවූ; භගවාන්, භාග්‍යවත්තෙම; යතඃ, යම්හෙයකින්; ඉහ, මේලොකයෙහි; අනුපගතං, අනාගතවූද; අතීතං, අතීතවූ හෙවත් ඉකුත්වූද; අභ්‍යුපෙතං වර්තමානවූද; චරත්, ජඞ්ගමවූද; අචරත් ස්ථාවරවූද; ක්ෂයං, අනිත්‍යවූද; අක්ෂයඤ්ච, නිත්‍යවූද; කෘත්ස්නම්, සියල්ල, බොධිමූලෙ, බොධිවෘක්ෂමූලයෙහි; සුබුබොධ, මනාකොට අවබොධ කළසේක්ද; තතඃ, එහෙයින්; සඃ, ඒ භාග්‍යවත්තෙම; බුද්ධඃ, සම්බුද්ධනම් වනසේකි.

34 දිබ්බඤ්ච චක්ඛාසවසඞ්ඛයො ච
එතානි ඤාණානි ඉධට්ඨවිජ්ජා
අලංකරුං යා මුනිධම්මදෙහං
විසෙසසොභා ගුණමජ්ඣුපෙතා"

යනුහෙයින් විදර්ශනාඥානය, මනොමයසෘද්ධිඥානය, සෘද්ධිවිධ ඥානය, දිව්‍යශොත්‍රඥානය, පරචිත්තඥානය, පූර්වේනිවාසානුස්මෘති ඥානය, දිව්‍යංචක්ෂුරභිඥානය, ආශ්‍රවක්ෂයකර ඥානය, යනමේ අෂ්ටවිධ ඥානයයි.

මේඅෂ්ටවිධඥානය සවිෂයවිදිතකරණාර්ථයෙන් "අෂ්ටවිද්‍යා" නම්වේ.මේ අෂ්ටවිද්‍යාවන් අතුරෙන් ප්‍රථමොද්දිෂ්ටවූ විදර්ශනාඥාන යතෙම උදයව්‍යයානු දර්ශනඥානය, භඞ්ගානුදර්ශනඥානය, භයතූ පට්ඨානඥාණය, ආදීනවානුදර්ශනඥානය, නිර්විදනුදර්ශනඥානය, මුඤ්චිතුකම්‍යතාඤාණය, පටිසඞ්ඛානුපස්සනාඤානය, සඞ්ඛාරුපෙක්ඛා ඤාණය, සත්‍යානුලොමඥානයයි කියා නවවැදෑරුම්වේ. මේ නව වැදෑරුම්වූ විදර්ශනාඥානයන් අතුරෙන් 'උදයව්‍යයානු දර්ශන ඥානය' නම් මේ නාමරූපයාගේ උත්පත්තියට පූර්වභාගයෙහි එක් තැනෙක්හි රාශි භූතව සිටීමකුත් නැත, පහළවන්නාහුගේ රාශි යක සිට එනගමනකුත් නැත, නැසෙන්නාහුගේ දිශානුදිශාවකට යාමකුත් නැත, නෑසුනුකල්හි එක්තැනක රැස්ව සිටීමකුත් නැත, වීණාගායනාකරණකල්හි පහළවූශබ්දය පළමුතැනක රැස්ව සිටීයේත් නොවෙයි, වෙනතෙනක සිටඅවුත් පහළවූයේත් නොවෙයි නිරුද්ධව අනික්තෙනකටගියෙත් නොවෙයි, වැලිකෙසේද? වීණාය උපවීණය, පුරුෂයාගේ තදනුරූපවූ ව්‍යායාමය'යනමෙතීකාරණ යෙන් පෙරනැතිව ඇතිවූයේද; එපරිද්දෙන් සියලු රූපාරූපධර්ම

---

(33) විපස්සනාඤාණං, විදර්ශනාඥාණයද; මනොමයිද්ධි, මනොමය සෘද්ධිඥාණයද; අපිච, නවද; ඉද්ධිප්පභෙදො, සෘද්ධිවිධඥාණයද; දිබ්බසොතං, දිව්‍යශ්‍රොත්‍රඥාණයද; පරසත්තචෙතොපරියායඤාණං, පරචිත්තවිජානනඥාණයද; පුබ්බෙනිවාසානුගතඤ්චඤාණං, පූර්වේ නිවාසානුස්මෘතිඥාණයද,

(34) දිබ්බඤ්චචක්ඛු, දිව්‍යංචක්ෂුරභිඥාණයද; ආසවසඞ්ඛයොච, ආශ්‍රවක්ෂයකරඥාණයද; (යන) එතානිඤාණානි, මේනුවතානු; ඉධ' මෙහි; අට්ඨවිජ්ජා, අෂ්ටවිද්‍යානම්වෙත්; යා, යම්විද්‍යාවො; මුනිධම්ම දෙහං, සම්බුද්ධයන්ගේ ධර්මශරීරය; අලඞ්කරුං, අලඞ්කාරකළාහුද (ඒවිද්‍යාවෝ) ගුණං, ගුණයට; අජ්ඣුපෙතා, උපගතවූ; විසෙස සොභා, විශිෂ්ටශොභා ඇත්තාහුයි.

යෝ නැතිව ඇතිවන්නාහ, ඇතිව නැතිවන්නාහුයයි යනාදීන් පවත්නා ඥානයයි.

“භඞ්ගානුදර්ශනඥානය, නම් යම්සේ ඇස්ඇති පුරුෂයෙක් ගංතෙරෙක හෝ පොකුණුතෙරෙක සිටියේ මහපොද ඇති වැසි වස්නාකල්හි දියපිට මහත් මහත් බුබුලුනැගී ශීඝ්‍රශීඝ්‍රව බිඳෙන සේ දකීද, එපරිද්දෙන් සියලු සංස්කාරධර්මයෝ බිඳෙති බිඳෙතියි දක්නාවූ ඥානයයි.

“භයතුපට්ඨානඥානය” නම් සියලු සංස්කාරධර්මයන් භඞ්ගානුපස්සනාවශයෙන් භාවනාකරන්නාවූ යොගාවචරයාහට සියලු භව යොනි ගති ස්ථිති සත්වාවාසගතවූ සංස්කාරධර්මයෝ සැපසේ ජීවත්වනුකැමති භීරුකපුරුෂයක්හට සිංහ ව්‍යාඝ්‍රයක්ෂරාක්ෂසාශිර්විෂාදීන් මෙන් වැටහෙද්ද එබඳුවූ ඥානයයි.

“ආදීනවානුදර්ශනඥානය”නම් මෙසේභයතුපට්ඨාන ඥානය ආසෙවනය කරන්නාවූ පුරුදුකරන්නාවූ යොගාවචරයාහට මරණීයාකාරයෙන් පිහිටියාවූ සිංහව්‍යාඝ්‍රාදි චණ්ඩසත්වාධිෂ්ඨිත වන ගහනයක් මෙන්ද, රාක්ෂසපරිගෘහීත පුෂ්කරණියක් මෙන්ද කඩුගත් අත්ඇති ශත්‍රුභටයන් මෙන්ද, විෂමිශ්‍ර භොජනයක් මෙන්ද, ගිනිගත් ගෙයක් මෙන්ද, සියලු සංස්කාරධර්මයන් උපද්‍රවාකාරයෙන් වැටහෙන්නාවූ ඥානයයි.

“නිර්විදානුදර්ශනඥානය” නම් යම්සේ චිත්‍රකූටපර්වත ප්‍රාන්තයෙහි ඇලී වාසයකරන්නාවූ සවර්ණහංසරාජයෙක් අපවිත්‍රවූ චණ්ඩාලගාමද්වාරයෙහි ගවරවලෙක ඇලී වාසය නොකෙරේද, එපරිද්දෙන් සියලු සංස්කාරධර්මයෙහි නිර්වෙදාකාරයෙන් පවත්නාවූ ඥානයයි.

“මුඤ්චිතුකම්‍යතාඥානය” නම් දැලෙහි බැඳුනුමත්ස්‍යයෙකු මෙන්ද, සර්පමුඛයට පැමිණි මණ්ඩූකයෙකු මෙන්ද, මැදිරියෙකලූ පක්ෂියෙකු මෙන්ද, ගරුඩමුඛයට පැමිණි නාගරාජයෙකු මෙන්ද, රාහුමුඛගත චන්ද්‍රයා මෙන්ද, සියලු සංස්කාරධර්මයන් කෙරෙන් මිදෙනුකැමතිව පවත්නා ඥානයයි.

“යම්සේ මසුන් අල්ලනුපිණිස දියටබට පුරුෂයෙක් මත්ස්‍යයෙක යන සංඥායෙන් කෘෂ්ණසර්පයාගේ ග්‍රීවය තරකොට අල්වාගෙණ මහත් මත්ස්‍යයෙකු ලදිමියි සතුටුව දියෙන්ඔසවා බලා සෝවැති තුන දැක භීතව දෙෂ දැක කලකිරී ගැලවියනු කැමතිව හරණට උපාය කරණුයේ වාලධිය අගපටන් අත වෙලා

ගත් දරණමුදු අත ඔසවා වාලධිය ගෙණ දෙතුන්විටෙක ඉහ වට කරකවා දුඹිලකොට 'යා දුෂ්ටසර්පයයි' දුරදමා යුහුව ගොඩ නැගී මහත් විෂඝොර සර්පමුඛයකින් ගැලවී ගියෙමියි ආපසු බලමින් සිටීද එපරිද්දෙන් මෙහි යෝගාවචරයාපළමුවෙන්ආත්ම භාවය ලැබ සතුටුවූ කාලය දියයටදී සර්පයෙකු අල්වා මසෙකු අල්වාගතිමියි සතුටුවූවාක්මෙනි, අනිත්‍යය දුඃඛය අනාත්මයයි ත්‍රිලක්ෂණය දුටුවා සොවැතිතුන දුටුවා මෙනි, සංස්කාරධර්මයෙහි භයඤාණය පහළවීම සර්පයා දැක භයගත් කාලය මෙනි, ආදීනවානුදර්ශනඥානය සර්පයාගෙන් වන උපද්‍රව්‍ය දුටුවාක් මෙනි, නිර්වේදඥානය සර්පයා කෙරෙහි කලකිරුණාක්මෙනි, භවයෙන් මිදෙනුකැමති මුඤ්චිතුකාම්‍යතාඤාණය සර්පයාකෙරෙන් මිදෙනු කැමතිවූවාක් මෙනි, පටිසංඛානුපස්සනා ඤාණය ඒ පුරුෂ සර්පමුඛයෙන් මිදීමට උපාය කළාක් මෙනි.

"සංඛාරුපෙක්ඛාඤාණය" නම් යම්සේ ගින්නටදැමූ කුකුළු පියාපිය ආපස්සට තරකැවෙනුමිස ගිනිදැසාවට නොඒද, එපරිද්දෙන් සියලු සංස්කාරධර්මයන්කෙරෙහි නොඇලී මධ්‍යස්ථාකාරයෙන් පවත්නා ඥානයයි.

"සත්‍යානුලොමඥානය" නම් යම්සේ ධර්මිෂ්ඨවූ රජෙක් අධිකරණ විනිශ්චයස්ථානයෙහි උන්ගේ අධිකරණනායකයන් අට දෙනෙකු කළ යුක්තිවිනිශ්චය අසා ඡන්දාදියෙන් අගතියට නොගොස් මැදහත්වූ අධිකරණනායකයන් අටදෙනාටද, පූර්වරාජධර්මයටද, අනුකූලව විනිශ්චයකළනියා යහපතැයි අභිමතවේද, එපරිද්දෙන් මේ යථොක්තවූ උදයව්‍යයාදි අෂ්ටවිදර්ශනඥානයන්ටද; සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ටද, අනුකූලව පවත්නා ඥානයයි.

"මනොමයඍද්ධිඥානය" නම් මුදුනනපඳුරකින් තණගොබක් උදුරන්නාක්මෙන්ද, කොපුයෙකින් කඩුපතක් හයාගන්නාක් මෙන්ද, කරඬුවකින් සර්පයකු නිකුත්කරන්නාක් මෙන්ද, මේශරීරයෙන් රූපවත්වූ මනොමයවූ සර්වාඞ්ගප්‍රත්‍යඞ්ගයෙන් යුක්තවූ සංස්ථානවශයෙන් අවිකලවූ චක්ෂුරාදී ඉන්ද්‍රියයන් ඇති අන්ශරීරයක් නිර්මිතකිරීමට සමර්ථවූ ඥානයයි.

"ඍද්ධිවිධඥානය" නම් ආවිර්භාව තිරොභාවාදි අනෙකප්‍රකාරවූ ඍද්ධිකොට්ඨාසයන් ප්‍රත්‍යක්ෂකරන්නාවූ ඥානයයි.

35 "අණිමා ලඝිමා ප්‍රාප්තිඃ—ප්‍රාකාම්‍යං මහිමා තථා
ඊශිතා වශිතා චෛව—යත්‍ර කාමාවසායිතා"*

මෙහි සූක්ෂ්මවූ රූපනිර්මාණයද, ශරීරය සූක්ෂ්මභාවයට පමුණුවා අදර්ශනයට යාමද 'අණිමා, නම්වේ; ආකාශයෙහි යාම් ඊම් ආදියට යොග්‍යකොට ශරීරය ලඝුබවට පැමිණවීම 'ලඝිමා නම්වේ; දිව්‍යබ්‍රහ්ම ලොකාදි යම් කිසිතැනකට වෙහෙසනැතිව ඇසිල්ලකින්යාම 'ප්‍රාප්ති, නම්වේ; අධිෂ්ඨාන විකුර්වණ මනොමය ඍද්ධිවශයෙන් ඊප්සිතාර්ථ නිෂ්පාදනය 'ප්‍රකාම්‍ය, නම්වේ; ආකාශයෙහි ස්ථානනිෂද්‍යාදි ඉරියව්පැවැත්වීමද, හිරසඳ අත්ලෙන් පිරිමැදීම් ආදියද. ශරීරය මහත් බවට පැමිණවීමද 'මහිමා, නම්වේ; ස්වයංවශිතායෙහි ඉසුරුබව 'ඊශිතා, නම්වේ; ඍද්ධිවිධාදීයෙහි වශීභාවය 'වශිතා, නම්වේ; ආකාශයෙහි යන්නහුගේ හෝ අන් යම්කිසිවක් කරන්නහුගේ හෝ නිෂ්ඨාප්‍රාප්තිය 'යත්‍රකාමාවසායිතා, නම්වේ; මේ යථොක්තවූ ලොකප්‍රතීත අෂ්ටමහාසිද්ධිය බුදුන්ගේ ඍද්ධිවිධඥානයෙහිම අන්තර්ගතයි.

"දිව්‍යශ්‍රොත්‍රඥානය" නම් දිව්‍යමයවූද මානුසිකවූද දූරස්ථවූද සමීපස්ථවූද ශබ්දශ්‍රවණයට සමර්ථවූ ඥානයයි.

"පරචිත්තවිජානනය" නම් තමාගේ චිත්තයෙන් අනුන්ගේ චිත්තය සරාගාදි සොළොස් ආකාරයකින් පිරිසිඳදන්නා නුවණයි.

---

(35) අණිමා. සියුම්රූපමැවීම්ආදි අණිමාවද; ලඝිමා, ශරීරය ලඝුත්වයටපැමිණවීම් සඞ්ඛ්‍යාතලඝිමාවද; ප්‍රාප්තිඃ, ක්ෂණයකින් ගමන්කිරීමයයිකියනලද ප්‍රාප්තියද; ප්‍රකාම්‍යං, ඊප්සිතාර්ථනිෂ් පාදන සඞ්ඛ්‍යාතප්‍රකාම්‍යයද; මහිමා, ආකාශයෙහි ඉරියව් පැවැත් වීම් ආදිමහිමාවද; තථා, එසේම; ඊශිතා, ස්වයංවශිතායෙහිඉසුරු බවයයිකියනලද ඊශිතාවද; වශිතාචෛව, ඍද්ධිවිධාදියෙහිවශිත්ව යද; යත්‍රකාමාවසායිතා, නිෂ්ඨාප්‍රාප්තිලක්ෂණ යත්‍රකාමාවසායිතා වද; (යනමොහු බුදුන්ගේ ඍද්ධිවිධඥාණයෙහි) වෙති.

---

* මෙහි පරාර්ධය

"ඊසිත්වඤ්ච වශිත්වඤ්ච තථාකාමා වසායිතා"

කියාත් සංස්කෘත ග්‍රන්ථාන්තරයෙහි පාඨයි.

"අණිමා මහිමා චෛව ගරිමා ලඝිමා තථා
ප්‍රාප්තිඃ ප්‍රකාම්‍ය මීශිත්වං වශිත්වං චාෂ්ට සිද්ධයඃ"

යනු මහෙශ්වර ශර්මයන්විසින් නිදර්ශිත පරිදියි.

"පූර්වේනිවාසානුස්මෘතිඥානය" නම් නාමගොත්‍රාදි වශයෙන් තමාගේද අනුන්ගේද පෙරවිසූ කඳපිළිවෙල දන්නා නුවණයි.

"දිව්‍යචක්ෂුරභිඥානය" නම් දිවැසින් සත්වයන්ගේ චුති උපත්තිආදිය දන්නානුවණයි.

"ආශ්‍රවක්ෂයකරඥානය" නම් "දුක්ඛ සමුදය නිරොධ මාර්ග" යන චතුරාර්‍ය්‍ය සත්‍යයන් තත්වූපරිද්දෙන් දොළොස් ආකාරයෙකින් දැනගන්නා අර්හත් මාර්ගඥානයයි; මේ අෂ්ටවිධවූ ඥාණය සවිෂය විදිතකරණාර්ථයෙන් "අෂ්ඨවිද්‍යා" නම් වේ.

"විදිතං කරොතීති විජ්ජා—වෙදනං වින්දතීති එතායවාති විජ්ජා—වින්දියං වින්දතීතිවිජ්ජා-යථාවතො උපලබ්භතීති අත්ථො අත්තනො වා පටිපක්ඛස්ස විජ්ඣනට්ඨෙන විජ්ජා—තමොක්ඛන්ධාදිකස්ස පදාලනට්ඨෙනාති අත්ථො—තතො එව අත්තනො විසයස්ස විදිතකරණට්ඨෙනාපි විජ්ජා"

"චරණ" නම්,

"සීලං චරං ඉන්ද්‍රිය සංවරො ච
මත්තඤ්ඤුතා ජාගරියානුයොගො
සද්ධාහිරොත්තප්ප බහුස්සුතත්තං
පරක්කමො චෙව සතී මතී ච
චත්තාරිඣානානි ච නානි මානි
තිපඤ්චධම්මා චරණානි ජඤ්ඤා"

යනුහෙයින් සීලසංවරය, ඉන්ද්‍රියෙහි ගුප්තද්වාරබව්ය, භොජනයෙහි මාත්‍රඥබව්ය, ජාගර්‍ය්‍යානුයොගය, ශ්‍රද්ධා හ්‍රී අපත්‍රපාබාහුශ්‍රැත්‍ය වීර්‍ය්‍ය ස්මෘති ප්‍රඥ යන මේ එකොළොස හා රූපාවචර ධ්‍යානසතරය, යනමේ පසළොසයි—මෙහි.

36 "නවකොටිසහස්සානී-අසීතිං සතකොටියො-
පඤ්ඤාසං සතසහස්සානි-ඡත්තිංසා ච පුනාපරෙ-

37 එතෙ සංවර විනයා-සම්බුද්ධෙන පකාසිතා
පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨා-සික්ඛා- විනයසංවරෙ"

---

(36 නවකොටිසහස්සානි, නවකෙළදහසක්ද; අසීතිංසත කොටියො, අසූසියක්කෙළක්ද; පඤ්ඤාසංසතසහස්සානි, පනස් ලක්ෂයක්ද; පුන නැවත; අපරෙ, අනික්; ඡත්තිංසාච, තිස්හයක්ද

(37) එතෙසංවරවිනයා, මේසංවරවිනයධර්මයෝ; සම්බුද්ධෙන, බුදුන්විසින්; පකාසිතා, ප්‍රකාශකරණලද්දාහුය; පෙය්‍යාලමුඛෙන පෙය්‍යාලද්වාරයෙන්; විනයසංවරෙ, විනයසංවරයෙහි; සික්ඛා, ශික්ෂාවෝ; නිද්දිට්ඨා, දක්වනලද්දාහුයි.

යනාදීන් දක්වනලද නවකෙළදහස් අසූ සියක්කෙළ පණස් ලක්‍ෂසතිස් මහා සංවරසීලය "සීලසංවර" නම්වේ, රූපශබ්දාදී ෂඩාලම්බනයෙහි එළඹ උපදනා ලොභ ද්වෙෂ මොහ යයි කියන ලද කෙලෙස්සොරුන් දුරුකොට ඔවුන් චක්‍ෂුර්ද්වාරාදි ස්දොරින් වැද්දනොදී ස්මෘති කවාටය වසා සිහිනුවණින් යෙදී විසීම ඉන්ද්‍රියෙහි 'ගුප්තද්වාරබව' නම්වේ. භුඤ්ජිතව්‍යාර්ථයෙන් 'භොජන' නම්වූ "චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය" යන චතුර්විධ ප්‍රත්‍යයන්ගේ පමණදැන පරිභොග ප්‍රතිග්‍රහණ පර්‍යෙෂණාදිය භොජනයෙහි 'මාත්‍රඥබව' නම්වේ.

භාවනාදියෙහි යෙදීමෙන් නිදිමරා නුනුවණ දුරුකිරීම 'ජාගර්‍ය්‍යානුයොග' නම්වේ; ශමිත ශෛවාල පඞ්කයන් ඇතිකොට දියපහදවන්නාවූ උදක ප්‍රසාදක මාණික්‍යයක්මෙන් සහජාත චිත්තචෛතසික ධර්මයන් ප්‍රසන්නකරන්නාවූ ශොභනාඛ්‍ය චෛතසිකධර්මය 'ශ්‍රද්ධා' නම්වේ; පාපයෙහි ජුගුප්ෂාකාරයෙන් පවත්නාවූ ලජ්ජාව 'හ්‍රී' නම්වේ; පාපයෙහි භයාකාරයෙන් පවත්නාවූ ඔත්තප්පය 'අපත්‍රපා' නම්වේ; ලොවඇති සියලු ශාස්ත්‍රදැනීම 'බාහුශ්‍රැත්‍ය' නම්වේ; භාරොවහනයෙහි ධුරවෘෂභයෙකුමෙන් කුශල ධර්මයන් මනාකොට ප්‍රයොගකිරීමෙහි උත්සාහ 'වීර්‍ය්‍ය' නම්වේ; ප්‍රගුණ ග්‍රන්ථයක් මෙන් ආලම්බන ස්මරණය කරන්නාවූ සිහි 'ස්මෘති' නම්වේ; ත්‍රෛභූමක සංස්කාරධර්මයන් අනිත්‍යාදිවශයෙන් අනෙකප්‍රකාරයෙන් දැනගන්නාවූ ඥාණය 'ප්‍රඥ' නම්වේ-මේධර්මයන් එකොළොස්දෙනා හා රූපාවචර ධ්‍යානයෝ සතරදෙන "පසළොස්චරණධර්ම" නම්වෙත්.

"පාදෘග්‍රම්ප්‍රපදම්පාදඃ-පදඞ්ඝ්‍රිශ්චරණෝස්ත්‍රියාම්" යනුනිඝණ්ඩු හෙයින්මෙතැන්හි 'චරණ' නම්පාදයයි—"අරියසාවකො එතෙහි චරති අමතංදිසං ගච්ඡතීතිචරණං—විජ්ජාච චරණං ච විජ්ජාචරණං-සමන්නාගතො පන්නො පන්නාපුණ්ණොතිසම්පන්නො-අථවා සම්මදෙවපන්නො ගතො උපගතොති සම්පන්නො—විජ්ජාචරණෙන සම්පන්නොවිජ්ජාචරණසම්පන්නො" බුදුහු, පූර්වොක්තවූ අෂ්ටවිද්‍යාවෙන් හා මෙකිපසළොස් චරණධර්මයෙන් යුක්තහෙයින් සම්පූර්ණවූහෙයින් "විජ්ජාචරණසම්පන්න" නම්වනසේක.

"විපස්සනාඤාණ මනොමයිද්ධි
ඉද්ධිප්පභෙදො පිච දිබ්බසොතං
පරස්ස චෙතොපරියාය ඤාණං
පුබ්බෙනිවාසානුගතඤ්ච ඤාණං

දිබ්බඤ්ච චක්ඛාසවසඞ්ඛයො ච
එතානි ඤාණානි ඉධට්ඨවිජ්ජා
අලංකරුං සා මුනිධම්මදෙහං
විසෙසසොභා ගුණමජ්ඣුපෙතා”

මේ අෂ්ටවිද්‍යාසඞ්ග්‍රහ ගාථාදෙකයි.

38 “සීලං වරං ඉන්ද්‍රියසංවරො ච
මත්තාසිතා ජාගරියානුයොගො
සද්ධා හිරොත්තප්ප බහුස්සුතත්තං
පරක්කමො චෙව සතීමතීච–

39 චත්තාරිඣානානි ච තානිමානි
තිපඤ්චධම්මා චරණානි ඤෙය්‍යා
එතෙහි විජ්ජාහි ච සම්පයොගා
සම්පන්නවිජ්ජා චරණො මුනින්දො

මේ පසළොස් චරණධර්මසඞ්ග්‍රහ ගාථාදෙකයි.

“සුගතො” යනතන්හි බුදුහු ශොභනගතිසඞ්ඛ්‍යාත විශුද්ධාර්‍ය්‍යමාර්ගයෙන් නිර්‍වාණපුරයට ක්ෂිප්‍රාභිඥ වශයෙන් ගියහෙයින් ‘සුගත’ නම්වනසේකි. තවද, දීපඞ්කරපාදමූලයෙහි පටන් බොධිමූලය දක්වා සමත්‍රිංශත් පාරමිධර්මයන් පුරණසේක් අවිපරීතප්‍රතිපත්තියෙන් සියලුසත්ත්වයන්ට හිතසැපඑළවමින් ‘ශාශ්වතොච්ඡෙදකාම සුඛ ආත්මකලමථ’ යනචතුරන්තයට නොපැමිණ ආර්‍ය්‍යමාර්ගගතියෙන මනාකොට ගියබැවිනුත් ‘සුගත’ නම්වනසේකි— තවද, සකලසංස්කාරප්‍රවෘත්තීන්ගේ අභාවයෙන් එකාන්තසුන්දරවූ අමෘත මහා නිර්වාණයට ගිය හෙයිනුත් ‘සුගත’ නම් වනසේකි— තවද,

(38) සීලංවරං, උත්තමශීලයද; ඉන්ද්‍රියසංවරොච, ඉන්ද්‍රියයන්ගේ සංවරයද; මත්තාසිතා, ප්‍රමාණයෙන්යුක්තඅනුභවයද; ජාගරියානුයොගො, නිදිදුරුකිරීමෙහි යෙදීමද; සද්ධා ශ්‍රද්ධාවද; හිරොත්තප්පං, හිරිඔතප්දෙකද; බහුස්සුතත්තං, බහුශ්‍රැතභාවයද; පරක්කමොචෙව, පරාක්‍රමසඞ්ඛ්‍යාතවීර්‍ය්‍යයද; සති, සමෘතියද; මතිච, ප්‍රඥාවද;

(39) චත්තාරිඣානානිච, (ප්‍රථමධ්‍යානාදිරූපාවචර) ධ්‍යානසතරද; (යන) තානිඉමානි, ඒමේ; තිපඤ්චධම්මා, පසළොස්ධර්මයෝ, චරණානි, චරණධර්මයෝයයි; ඤෙය්‍යා, දැනගන්නේයි; එතෙහි, මේචරණධර්මයන්ගෙන්ද; විජ්ජාහිච, (යථොක්ත) අෂ්ටවිද්‍යාවෙන්ද, සම්පයොගා, සම්ප්‍රයුක්තබැවින්; මුනින්දො, සර්‍වඥතෙම; සම්පන්නවිජ්ජාචරණො, විජ්ජාචරණසම්පන්නවනසේක.

තත්තත්මාර්ගයෙන් ප්‍රහීණ ක්ලේශයන් අපුනරාවෘත්ති කාරණවශ
යෙන් මනාකොට ගියහෙයිනුත් 'සුගත' නම් වනසේක්.—
තවද, යුක්තවචනයෙක් නිෂ්පාද්‍ය කල්හි සත්‍ය සාර්ථ ප්‍රියවචන
යන් කථනයකරණ හෙයිනුත් 'සුගත' නම් වනසේක්.—තවද,
ද්වාත්‍රිංශද්වර මහාපුරුෂලක්ෂණාශීත්‍යනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභා
රඤ්ජිතරූපකාය සම්පත්තියක් ඇතිබැවින් ද්‍රුතවිලම්බිතස්ඛලි
තානු කර්ෂණ නිෂ්පීඩනෝත්කුටිතාකුටිලතාදිදෝෂ රහිතව අපහ
සිත්රාජහංස වෘෂභවරවාරණ මෘගරාජගමනවිලාස ඇති ශෝභ
නවූ කායගමනින් යුක්තහෙයිනුත් 'සුගත' නම්වනසේක්.

මෙහි "ද්වාත්‍රිංශද්වරමහාපුරුෂලක්ෂණ" නම් කවරහයත් "සුප්ප
තිට්ඨිතපාදො-හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි සහස්සරානි
සනෙමිකානි සනාභිකානි සබ්බාකාර පරිපූරානි—ආයතපණ්හි
දීඝඞ්ගුලිමුදුතලුණහත්ථපාදො-ජාලහත්ථපාදො උස්සඞ්ඛපාදො-එණි
ජංඝො-ඨිතකො අනොණමන්තො උභොහි පාණිතලෙහි ජණ්ණු
කානි පරිමසති පරිමජ්ජති—කොසොහිතවත්ථගුය්හො--සුවණ්ණ
වණ්ණො කඤ්චනසන්නිභත්තචො-සුඛුමච්ඡවි සුඛුමත්තා ඡවියා
රජොජල්ලං කායෙ න උපලිප්පති—එකෙකලොමො එකෙකානි
ලොමානි ලොමකූපෙසු ජාතානි-උද්ධග්ගලොමො උද්ධග්ගානි ලො
මානි ජාතානි නීලානි අඤ්ජනවණ්ණානි කුණ්ඩලාවත්තානි පද
ක්ඛිණාවත්තකජාතානි—බ්‍රහ්මුජ්ජුගත්තො--සත්තුස්සදො—සීහපු
බ්බද්ධකායො-චිතන්තරංසො-නිග්‍රොධපරිමණ්ඩලො යාවතක්වස්ස
කායො තාවතක්වස්ස ව්‍යාමො යාවතක්වස්ස ව්‍යාමො තාවතක්වස්ස කා
යො-සමවත්තක්ඛන්ධො-රසග්ගසග්ගී-සීහහනු-චත්තාලීසදන්තො
සමදන්තො- අවිවරදන්තො—සුසුක්කදාඨො-පහූතජිව්හො- බ්‍රහ්ම
ස්සරො කරවීකභාණී-අභිනීලනෙත්තො—ගොපඛුමො- උණ්ණා
භමුකන්තරෙ ජාතා ඔදාතා මුදුතූලසන්නිභා-උණ්හීසසීසො"යි.

මෙහි "සුප්පතිට්ඨිතපාදො" යනුතන්හි සුප්‍රතිෂ්ඨිතපාදනම්කව
රයත්? අන්‍යයන් පතුල් බිම ඔබනකල අක්පතුල හෝ පාෂ්ණිය
හෝ පළමුකොට භූමිස්පර්ශකෙරේ; පාදතලමධ්‍යයෙන් ඡිද්‍රහෝ
වෙයි, පත්ල නගනකලත් අග්‍රපාදතලාදීන් කෙරෙන් අන්‍යතර
ස්ථානයෙක් පළමුකොට නැගේ—ඒ බුදුන්ගේ පතුල්වූකල සුව
ර්ණපාදුකා සෙයින් එකපැහැර භූමිස්පර්ශකෙරේ එකපැහැර නැ
ගේ—ඉදින් බුදුහු අනේකශතපෞරුෂ ප්‍රපාතයෙහි ඇක්
මෙම් තබමියි ශ්‍රීපාදය එයට එළවූසේක්වීනම් එමවිගස වළතැන්
වයින් පිරුණු භස්ත්‍රා සෙයින් කඹුරුහම සෙයින් පිරේ; ගොඩ

තැන් හෙරිතලසෙයින් සමවේ-දුර ඇක්මෙම්හි ශ්‍රීපාදය තැගු සේක්වී නම් යමකප්‍රාතිහාර්‍ය්‍යාවසානයෙහි සෙයින් මේරුප්‍රමාණ පර්වතයකුදු හුයාපි වේ අගබඩක් සෙයින් තැමී ශ්‍රීපාද සමීපයට උපගතවේ; ලංවේ.

40 නින්නං ඨානං උණ්ණමති-ගච්ඡන්තෙ ලොකනායකෙ
උන්නතඤ්ච සමං හොති-පඨවී ච අචෙතනා—

41 පාසාණා සක්ඛරා චෙව- කඨලා ඛාණුකණ්ටකා
සබ්බෙ මග්ගා විවජ්ජෙන්ති- ගච්ඡන්තෙ ලොකනායකෙ

42 ගච්ඡතො බුද්ධසෙට්ඨස්ස-හෙට්ඨා පාදතලං මුදු
සමං සම්ඵුසතෙ භූමිං- රජසා නුපලිප්පති—

43 නාගවික්කන්තචාරො සො- ගමනෙ සොභතෙ ජිනො
චාරුං ගච්ඡති ලොකග්ගො-හාසයන්තො සදෙවකෙ"

යනු එහෙයින්මකියනලදී-මෙසෙයින් සුප්‍රතිෂ්ඨිතවූ පාදතල වය ඇතිවනබැවින් බුදුහු 'සුප්‍රතිෂ්ඨිතපාද, නම් වෙත්.

"හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි" යනාදිතන්හි චක්‍රයෝනම් කවරහයත්? බුදුන් ශ්‍රීපතුල්දෙක්හි දහස් දහස් දැවිඇති නිම් තැබ සහිත දෙවක්‍රයෙක්වී. ඒවටා "ස්වස්තිකය' ශ්‍රීවත්සය

---

40 ලොකනායකෙ, සර්වඥයන්වහන්සේ; ගච්ඡන්තෙ, වඩිනා කල්හි: නින්නංඨානං, නිම්නස්ථානය; උණ්ණමති, උන්නතවෙයි; උන්නතඤ්ච, උන්නතස්ථානයද; සමංහොති, සමවෙයි; (මෙසේ) අචෙතනා, චෙතනානැත්තාවූ; පඨවීච, පෘථිවියද සමවෙයි.

41 ලොකනායකෙ, ලොකස්වාමින්වහසේ; ගච්ඡන්තෙ, වඩිනා කල්හි; පාසාණා, ගල්ද; සක්ඛාරාචෙව, සකුරුද; කඨලා, කැබිලිතිද; ඛාණුකණ්ටකා, කණුකටුද; (යන) සබ්බෙ, සියල්ල; විවජ්ජෙන්ති, පහවයෙත්;

42 ගච්ඡතො,වඩින්නාවූ;බුද්ධසෙට්ඨස්ස, බුදුරජාණන්වහන්සේගේ; මුදු, මෘදුවූ; හෙට්ඨාපාදතලං, යටිපතුල; සමං, සමව; භූමිං පොළොව; සම්ඵුසතෙ, ස්පර්ශකරේ; රජසා, ධූලියෙන්; න උපලිප්පති, නොතැවරෙයි;

(43) සො ජිනො, ඒසර්වඥතෙම; ගමනෙ, යාමෙහි; නාගවික්කන්තචාරො, හස්තිවික්‍රාන්තගමනය ඇත්තේ; සොභතෙ, බබලයි; ලොකග්ගො, ලොකොත්තම මුනීන්ද්‍රතෙම; සදෙවකෙ, දෙවියන් සහිත සත්වයන්; හාසයන්තො, සතුටුකරන්නේ;චාරුං' මනොඥ ඥොට, ගච්ඡති, වඩියි.

නන්ද්‍යාවර්තය, ශ්‍රීවත්සකය, අවතංසකය, වර්ධමානකය, භද්‍රපීඨය, ප්‍රාසාදය, තෝරණය, ශ්වේතච්ඡත්‍රය, ඛඩ්ගය, තාලවෘන්තය, මායූරහස්තය, චාමරය, උෂ්ණීෂය, මණිය, සුමනාදාමය, නීලෝත්පලය, රක්තෝත්පලය, රක්තපද්මය, ශ්වේතපද්මය' පූර්ණකලසය, පූර්ණපාත්‍රය, සමුද්‍රය, චක්‍රවාටපර්වතය, හිමාලපර්වතය, මහාමේරුපර්වතය, සූර්යමණ්ඩලය, චන්ද්‍රමණ්ඩලය, සපරිවාර සතරමහාද්වීපය, සප්තරත්නසමන්විත චක්‍රවර්තිය, දක්ෂිණාවර්තශ්වේතශංඛය, ස්වර්ණමත්ස්‍යයුගලය, චක්‍රායුධය, සප්තමහාගංගාය, සප්තමහාශෛලය, සප්තමහාමුහුදය, සුපර්ණරාජය, සුංසුමාරය, ධ්වජය, පතාකාය, ස්වර්ණශිවිකාය, ස්වර්ණවාලවීජනිය, කෛලාශපර්වතය, සිංහරාජය, ව්‍යාඝ්‍රරාජය, වලාහක අශ්වරාජය, උපෝසථහස්තිරාජය, වාසුකීනාගරාජය, හංසරාජය, වෘෂභරාජය, ඓරාවණහස්තිරාජය ස්වර්ණමකරය, චතුර්මුඛ ස්වර්ණනෞකාය, සවත්සකධේනුය කිම්පුරුෂය, කින්නරිය, කුරවිකය, මයූරරාජය, ක්‍රෞංචරාජය, චක්‍රවාකරාජය, ජීවංජීවකරාජය, ෂඩ්විධදිව්‍යලෝකය, සොඩශවිධබ්‍රහ්ම ලෝකය, යනමෙතෙක් මංගල්‍යලක්ෂණයෝ පැනෙත්.

'මෙසෙයින් බුදුන් ශ්‍රීපතුල්දෙක්හි දහස් දහස් දැවිඇති නිම් නැබසහිත දෙසියසොළසක් මඟුල්ලකුණු පිරිවරණලද දෙචක්‍ර ලක්ෂණයෝ 'චක්‍ර' නම්වෙත්,

"ආයතපණ්හි" යනතන්හි ආයතවූපාර්ෂ්ණිනම්කවරයත් සම්පූර්ණවූ දික්විළුම්යැයි, සෙස්සන් අක්පතුල් දික්වේ; විළුම් මුදුනෙහි සිහින්කකුල්වේ; විළුම් සැසපිවාක්වැනිවේ; බුදුන්ට වූකලී එසේ නොවේ; බුදුන් ශ්‍රීපතුලෙහි සතරභාගයෙන් දෙභාගයක් අක්පතුල්වේ; තුන්වනභාගයෙහි ජඞ්ඝාප්‍රතිෂ්ඨිතවේ; සතරවන භාගයෙහි හිදි අගින්වටාපුවාක්වැනි රක්තකම්බලහෙණ්ඩුකයක් බඳුවිළුවේ මෙසෙයින් පිරුණු දික් විළුම් ඇතිවනබැවින් ආයතපාර්ෂ්ණි, නම්වෙත්.

"දීඝඞ්ගුලි" යනතන්හි බුදුහු දීර්ඝාඞ්ගුලි පරිදි කිසේයයත්? අනුන් ඇතැම් ඇඟිලි දික්වේ; ඇතැම් ඇඟිලිලුහුඬුවේ; බුදුන්ට වූකලී එසේනොවේ; බුදුන් හස්තපාදාංගුලීහු මකුළුවන් ඇඟිලිසෙයින් දික්ව මුලින් දළව ක්‍රමයෙන් ගොස් අගින් සිහින්ව නියසීංස තෛලයෙන් අනාවැටූ සිරියෙල් වැටිසෙයින් හොබිත්; මෙසෙයින් දික්වූ ඇඟිලි ඇතිවන බැවින් දීර්ඝාංගුලි, නම් වෙත්.

"මුදුතලුණහත්පාදෙ" යනතන්හි මෘදුවූතරුණවූ හස්තපාද ඇතිපරිදිකිසේය යත්? බුදුන් අතුල් පතුල් පහන් ගිතෙල ගලා

තුඹු සියක්වට පෙළු පුළුන් පෙදක් සෙයින් මොලොක් වේ; ජාත
මාත්‍ර කුමාරයක්හුගේ එවිගසඋපන් පැටවක්හුගේ අතුල් පතුල්
සෙයින් හැමකල්හි තරුණවේ; මෙසෙයින් මෘදුතරුණවූ අතුල්
පතුල් ඇතිවනබැවින් 'මෘදුතරුණ හස්තපාද' නම් වෙත්.

“ජාලහත්ථපාදො” යනතන්හි ඔවුන් ජාලහස්තපාද පරිදි කි
සේය යත්? සෙසු සත්වයන්ට පෙණඅත් පෙණපාවේ; බුදුන්ට
වූකලි අත සතර ඇඟිල්ලොද, පයපස්ඇඟිල්ලෝද, එකප්‍රමාණව
ඔවුනොවුන් පිළිමිදසිටිත්; දක්‍ෂ වඩුවකුවිසින් යොදනලද ජාල
කවුළුවක් මැනිවෙත්; මෙසෙයින් යුක්තවූහස්තපාද ඇතිවන
බැවින් 'ජාලහස්තපාද' නම්වෙත්.

උස්සංඛපාදෙ” යනතන්හි ඔවුන්උත්ශඞ්ඛපාද පරිදිකිසේය
යත්?අනුන් බොලට පිටිපයවේ;එයින්ඔවුන් පාඇණ පටසෙයින්
තදවේ; කැමතිසේ නොපිරිවැටේ; යනුවන් පතුල් නොපැනේ;
බුදුන්ටවූකලි තැඟි මත්තෙහි ගුල්එයෝ ගොප්මස්හු පිහිටියා
හුයි. එහෙයින් වඩනා බුදුන් නාභියපටන් ගෙණ ඌර්ධවශරීරය
නැවසිටි රන්පිළිමයක් සෙයින් නිශ්චලවේ; අධඃකායම චලිත
වේ; සුවයෙන් පාදයෝ පරිවර්තිත වෙති, පෙරළෙති; ඉදිරියෙ
හිද පිටිපසද දෙපසෙහිද සිට බලන්නවුන්ට පාදතලයෝ
පෙනෙත්; ඇතුන් පතුල්සේ ඔවුන් පිටිපසයට බලන්නවුන්ටම
පෙනෙන්නේනොවේ;මෙසේයින්උද්ගතවප්‍රතිෂ්ඨිතවූ ගුල්එයන්
ඇතිවනබැවින් 'උත් ශඞ්ඛපාද, නම්වෙත්.

“එණිජඞ්ඝා” යනතන්හිඔවුන් එණිජඞ්ඝපරිදිකිසේයයත්?
බුදුන් ජඞ්ඝා හාත්පස්හි සමව සිටි මසින්පරික්‍ෂිප්තව මනාකොට
වඩනාලද ඇල්ගැබ සෙයින් පරිපූර්ණවන බැවින් එණිමෘගයන්
ගේ (ඔළුමුවන්ගේ) ජඞ්ඝාවැනිහුයි බුදුහු'එණිජංඝ' නම්වෙත්.

“ඨිතකො” අනොණමන්තො” යනාදීතන්හි ඔවුන්සිට නො
නැමී දෙදණපිරිමදිනාපරදික්සේයයත්? සෙසුසත්වයෝ කුදුහෝ;
වෙති; කුරුහෝ වෙති; කුදුන්ගේ ඌර්ධවකාය අපරිපූර්ණවේ;
කුරුන්ගේ අධඃකාය අපරිපූර්ණවේ; ඒ කුදුකුරු සත්වයෝඅපරි
පූර්ණකාය වන බැවින් සිට නොනැමී දෙදණ පිරිමදිනට අස
මර්ථවෙත්; බුදුහුවූකලි පරිපූර්ණවූ උභයකාය ඇතිවන බැවින්
සිට නොනැමී දෙඅත්ලෙන් දෙදණ පිරිමදිනා සේකි.

‘‘කොසොහිතවත්ථගුය්හො” යනතන්හි ඔවුන් කොශයෙහි
වහිතවූවස්ත්‍රගුහ්‍යඇතිපරිදිකිසේය යත්?වෘෂභවාරණාදීන්ගේ
අඞ්ගජාත සෙයින් බුදුන්ගේපුරුෂව්‍යඤ්ජනයසවර්ණපද්ම කර්ණි

කාවක් බඳුවුරන්වන් පියන්පත්කෙමියක්වැනිකොශගර්භයෙහි අවහිතවේ; ප්‍රච්ඡන්නවේ; සැඟවේ; හේමවස්ත්‍රයෙන් ගුහ්‍යකට යුතුබැවින් 'වස්ත්‍රගුහ්‍ය'නම්වේ;මෙසෙයින් කොශයෙහිඅවහිතවූ වස්ත්‍රගුහ්‍ය ඇතිවන බැවින් කොශාවහිත වස්ත්‍රගුහ්‍ය, නම්වෙත්.

"සුවණ්ණවණ්ණො කඤ්චනසන්නිභත්තචො" යනතන්හි සවර්ණවර්ණපරිදිහාකාඤ්චන සන්නිභත්වක් පරිදි කිසේයයත් බුදුහු දෑහිඟුලෙන් මැද දිවිදළින්ගටා ගුරුපිරියම් කොට නිමවූ ගතරන් පිළිමයක්සෙයින්රන්වන්වූ සිරුරුහා ගනසිතිදු කපුත් කඳක් සෙයින් පහන් සිවිපැහැඇති වනසේකි.

"සුඛමච්ඡවි" යනාදිතන්හි සියුම් සිවිඇතිපරිදි කිසේයයත්? බුදුන්සිවිසියුම්වනබැවින් ධූලිහෝ දූලිහෝශරීරයෙහිනොඇලේ පද්මපත්‍රයෙහි උදකබින්දුසෙයින් විවතීවේ; අලපත තෙලුම්පත ගත් දියනතක්සෙයින් නොරඳයි,එනකුදුවූවත්,බුදුහු සෘතුග්‍රහණ සඳහාත් දායකයන්ට පුණ්‍යඵල සඳහාත් වෘත්තශීර්ෂයෙනුත් හස්තපාදදි ධොවනය කොට වදුරණසේකි. මෙසේ සියුම් සිවි ඇතිවනබැවින් 'සූක්ෂ්මච්ඡවි, නම්වෙත්.

'"එකෙකලොමො" යනතන්හි ඔවුන් එකිඑකි ලොම්ඇති පරිදි කිසේය යත්? සෙස්සන් එක් කූපයෙක්හි රොම දෙකක් තුණෙකු දුවෙත්; බුදුන්ටවූකලි එකි එකිකූපයෙහි එකි එකි රොමයෙක්මවේ;'එහෙයින් 'එකෙකරොම' නම්වෙත්.

"උඞ්ගගලොමො" යනතන්හි ඔවුන් ඌර්ධ්වාග්‍ර රොම ඇති පරිදි කිසේය යත්? බුදුන්ගේශරීරයෙහිතිල්වූ අඤ්ජන වර්ණවූ රොමයෝ දක්ෂිණාවර්තව අවතී පර්‍ය්‍යාවසානයෙහි උර්ධ්වාග්‍රව මූඛ ශොභා බලනුවන්සෙයින් සිටිත්.එහෙයින් බුදුහුඌර්ධ්වාග්‍රරොම නම්වෙත්.

"බ්‍රහ්මුජ්ජුගත්තො" යනතන්හි බ්‍රහ්මයාසෙයින් බුදුහු ඍජු ගාත්‍රඇති පරිදිකිසේය යත්?බොහෝසත්වයෝ සකන්ධයෙන්හෝ නැමෙත්; කටිප්‍රදෙශයෙන් හෝ නැමෙත්; දණමඩලින්හෝ නැමෙත්; කටීප්‍රදෙශයෙන් සිට නැමෙතුදු පිටදිසාවට නැමෙත්, සකන්ධයෙන් හා දණමඩලින් නැමෙත්නාහු ඉදිරියට නැමෙත්, දීඝශරීරඇති ඇතම්කෙනෙක් පාශ්වයෙන්වක්වෙත්; උඩුබලානකත් තරුගණනවුන්සෙයින්ඇවිදිත්;ඇතම්කෙනෙක්අල්පමාංස රුධිරවන බැවින් ශූලසදෘශව වෙවුලමින් ඇවිදිත්; බුදුන්ටවූකල ඍජුව උද්ගතවූ ශරීරය දිව්‍ය පුරයෙහි නැඟූ රුවන්තොරණක් සෙයින් ශොභමානවේ;මෙසේමහාබ්‍රහ්මයාගේ ගාත්‍රසෙයින්ඍජු වූ දීඝප්‍රමාණවූගාත්‍ර ඇතිවන බැවින් 'බ්‍රහ්මර්ජුගාත්‍ර'නම්වෙත්

“සත්තුස්සදෙ” යනතන්හි ඔවුන් සප්තස්ථානයෙකින් උත්සන්නපරිදි කිසේය යත්? බුදුහුදෙඅත්පිටය, දෙපාපිටය, දෙඅංසකූටය, ස්කන්ධය” යනමේ සප්තස්ථානයෙහි පරිපූර්ණවූ මාංසයෙන් උත්සන්නවනසේකි. අන්සත්වයන්ගේ අත්පිටද පාපිටද නහරවැල්වෙත්, අංසකූටයෙහිද; ස්කන්ධයෙහිද ඇටකොන්පෙනේ ඔහුමනුෂ්‍යප්‍රෙතයන් සෙයින් වැටහෙත්; බුදුහුවූකල එසේනෙවනසේකි, බුදුන්ට මේ සප්තස්ථානයෙහි පරිපූර්ණවූ මාංසොත්සද ඇතිවනබැවින් සැඟවී තිබෙන නහරවැල්වේ; රන්මිහිගු බෙරක්හාසමාන ස්කන්ධයවේ, එහෙයින්බුදුහු‘සප්තොත්සද;නම්වෙත්

“සීහපුබ්බඩ්ඪකායො” යනතන්හි ඔවුන් සිංහයාගේ පූර්වාර්ධකායබඳු ශරීරඇති පරිදි කිසේය යත්? සිංහයාගේ පූර්වාර්ධකායම පරිපූර්ණවේ; පශ්චිමකාය අපරිපූර්ණවේ. බුදුන්ටවූකල සිංහයාගේ පූර්වාර්ධයසෙයින් සර්වකාය පරිපූර්ණවේ, මෙසෙයින් සිංහයාගේ පූර්වාර්ධකාය සෙයින් පරිපූර්ණවූ සර්වකාය ඇතිවන බැවින් සිංහපූර්වාර්ධකාය, නම්වෙත්.

“චිතන්තරංසො” යනතන්හි ඔවුන් චිතවූ අන්තරාංස ඇති පරිදි කිසේය යත්? මෙහි‘අන්තරාංස’නම් පිටදෙඅංසයාගේමධ්‍යයයි. හේ බුදුන්ට චිතයි; පරිපූර්ණයි; සෙසුසත්වයන්ට ඒස්ථානය නිම්නවේ; වලවේ පිටදෙභාගයෝ වෙන වෙනම පෙනෙත්; බුදුන්ටවූ කලකටිප්‍රදෙශය පටන්ගෙණ මාංසපටලයෙක් ස්කන්ධයදක්වා උද්ගතව නැඟීරන්පෝරුවක් සෙයින්පිටවසා පිහිටියේයි; මෙසෙයින් චිතවූ පරිපූර්ණවූ අන්තරාංස ඇතිවන බැවින් ‘චිතාන්තරාංස’ නම්වෙත්.

“නිග්‍රොධපරිමණ්ඩලො” යනතන්හි ඔවුන් න්‍යග්‍රොධපරිමණ්ඩල පරිදි කිසේය යත්? යටසේ පනස්රියන් වන බැවින් හෝ සියක් රියන් වන බැවින් හෝ සමවූ කඳහා සමවූ ශාඛාඇති න්‍යග්‍රොධ වෘක්ෂය දිගිනුදු විස්තාරයෙදුනු සමප්‍රමාණවේද; එසේම බුදුහු කයිනුදු බ්‍යාමයෙනුදු සමප්‍රමාණවනසේකි. යම්පමණ කයවේද, එපමණ ව්‍යාමවේ. යම්පමණ ව්‍යාමවේද, එපමණ කය වේ. අන්සත්වයන්ගේ කය හෝ දීඝීවේ; ව්‍යාමය හෝ දීඝීවේ; මේසර්වඥයන්වහන්සේගේ එපරිද්දෙන් විෂමප්‍රමාණ නොද කසේකි—මෙසෙයින් සමප්‍රමාණවූකයහාව්‍යාමඇතිවන බැවින් ‘න්‍යග්‍රොධපරිමණ්ඩල ‘නම්වෙත්’

"සමවත්තක්ඛන්ධො" යනතන්හි ඔවුන් සමවෘත්තස්කන්ධ ඇති පරිදි කිසේයයත්? ඇතම්කෙනෙකුන්ට කොකුන්සෙයින් දික්වූ වක්වූ පලල්වූ ග්‍රීවාවේ; ඔවුන් කථාකරණ කල්හි ග්‍රීවයෙහි නහරවැල් පෙනේ; මඳව ස්වර නිගීතවේ. බුදුන්ටවූකල එසේ නොවේ. බුදුන්ට සුවෘත්තවූ රන්කලස කරක් බඳුවූ ග්‍රීවාවේ; බුදුන් කථාකර වදරණ කල්හි ග්‍රීවයෙහි නහරවැල් නොපෙනේ; මඳව ස්වර නිගීතනොවේ;මෙඝයක්හුගේ ගර්ජනාසෙයින් ගර්ජනා කරණ බුදුන්ගේ ස්වරමහත්වේ; මෙසෙයින් සම වට කඳට ඇතිවන බැවින් 'සමවෘත්තස්කන්ධ' නම්වෙත්.

"රසග්ගසග්ගී" යනතැන ඔවුන් රසග්‍රාසාග්‍ර පරිදි කිසේය යත්? ලවණාම්ල තික්තකටුකාදි රසයන්ගේ ග්‍රාසය අදනය කරණ සෙයින් රසනහර 'රසග්‍රාස' නම්වේ; හේ රසනහර අග්‍රවී නුයි 'රසග්‍රාසාග්‍ර'වේ. බුදුන්ගේ සත්සියයක් රසහරණීහු ඌර්ධ්වාග්‍රව ග්‍රීවයෙහිම පිහිටියාහුයි. එහෙයින් තලඇටයක් පමණ ආහාරයකුදු ජිහ්වාග්‍රයෙහි තබතලද්දේ සියලුශරීරයෙහි ඕජඃපතුරුවයි. උන්වහන්සේ පදන්භූමිය සාවුරුද්දක් මහාවීර්‍ය්‍ය කරණ කල්හි දවසකට එක්සහලැටෙකිනුදු කුලඳුලක් පමණවූ යූෂය කිනුදු ශරීරය රක්‍ෂාකෙළේ එසේ ඕජස් පතුරුවන හෙයිනි; සෙසුසත්ත්වයන්ගේ ශරීරයෙහි එසේ ඕජස් නොපැතිරෙණ හෙයින් ඔහු බොහෝ රොග පීඩා ඇතිවෙත්—මේ මහාපුරුෂලක්‍ෂණය අල්පාබාධතාසඞ්ඛ්‍යාත නිෂ්‍යන්දඵලවශයෙන් ප්‍රකටවේ; මෙසෙයින් රසයන්ගේ ග්‍රාසයෙහි අග්‍රවූ රසහරණීන් ඇතිවන බැවින් 'රසග්‍රාසාග්‍ර' නම්වෙත්.

"සීහහනු" යනතන්හි ඔවුන් සිංහහනුපරිදි කිසේයයත්? බුදුන් සිංහයාගේ හනුසදෘශ හනු ඇත්තේය; සිංහයාගේ අධස්තාත් හනුවම පරිපූර්ණවේ; උපරිෂ්ඨාත් හනුව අපරිපූර්ණවේ; බුදුන්ට වූකල සිංහයාගේ අධස්තාත් හනුවසෙයින් දෙහනුවම පරිපූර්ණවේ; පූර දෙලොස්වක සඳවැනිවේ. මෙසෙයින් සිංහයාගේ හනු සදෘශවූ හනුඇතිවන බැවින් 'සිංහහනු' නම්වෙත්.

"චත්තාලීසදන්තො" යනතන්හි ඔවුන් චත්වාරිංශත් දන්ත පරිදි කිසේය යත්? බුදුන්ගේ උපරිෂ්ඨාත් හනුයේ පිහිටි දන්තයෝ විසිදෙනෙක, අධස්තාත් හනුයේ පිහිටි දන්තයෝ විසිදෙනෙකැයි මෙසේ සතළිස් දන්ත කෙනෙක්වෙත්; සෙසුසත්වයන්ට දත් සම්පූර්ණවනකල දෙතිසෙක් වෙත්; බුදුන්ට සතළිසක් දන්තයන් ඇතිවනබැවින් 'චත්වාරිංශද්දන්ත' නම්වෙත්-

"සමදන්තා"යනතන්හි ඔවුන් සමදන්ත පරිදි කිසේයයත්? සෙසුසත්වයන්ගේ ඇතම් දත් උස්වේ. ඇතම් දත්මිටිවේ; මෙසෙ

දන්තයෝ විෂමවෙත්-බුදුන්ටවූකල යහතින් සිඳුනාලද සක් පතක් සෙයින් සමවෙත්. මෙසෙයින් සමවූදන්තයන් ඇතිවන බැවින් 'සමදන්ත' නම්වෙත්.

"අවිවරදන්තො" යනතන්හි ඔවුන් අවිවරදන්ත පරිදි කිසේයයත්? සෙසුසත්වයන්ගේ දත් කුමහිරයන් දත්සෙයින් විරලවේ; සිදුරුවේ; මත්‍ස්‍යමාංසාදිය අනුභවකරණකල දත් අතුරු පිරෙයි. බුදුන්ටවූකල පබළපතෙක්හි බඳනාලද විදුරු පෙළක්සෙයින් නොසිදුරුවේ;තෙලිතුඩින්දක්වනලද පරිච්ඡේද බඳුවූ දන්තයෝවෙත්—මෙසෙයින් අවිවරදන්තයන් ඇතිවන බැවින් "අවිවරදන්ත" නම්වෙත්.

"සුසුක්කදාඨො" යනතන්හි ඔවුන් සුශුක්ලදංෂ්ට්‍රාඇති පරිදි කිසේයයත්? සෙසුසත්වයන්ට පූතිදන්තයෝ නැගෙත්; එයින් ඔවුන් ඇතැම්දංෂ්ට්‍රා කෘෂ්ණවේ; විවර්ණවේ—බුදුන්ටවූකලී දව හත්තරු අභිභවා දිලියෙමින් ප්‍රභායෙන් යුක්තවූ සුෂ්ඨුශුක්ල දංෂ්ට්‍රාවේ; මෙසෙයින් අතිධවලවූ දංෂ්ට්‍රාඇතිවන බැවින් 'සුශුක්ල දංෂ්ට්‍රා' නම්වෙත්.

"පහූතජිව්හො" යනතන්හි ඔවුන් පහූතජිව්හාඇති පරිදි කිසේය යත්? සෙසුසත්වයන්ගේ දිව් ස්ථූලවේ; කෘශවේ; ලුහුඩු වේ; බඳදිව්වේ, විෂමදිව්වේ-බුදුන්ටවූකල මොලොක්වූ දික්වූ පළල්වූ වර්ණසම්පන්නවූ දිව්වේ, මෙසෙයින් ත්‍රිලක්ෂණ සම්පන්නවූ ජිව්හාඇති වනබැවින් 'පහූතජිව්හ' නම්වෙත්.

"බ්‍රහ්මස්සරො කරවීකභාණී යනතන්හි ඔවුන් බ්‍රහ්මස්සර පරිදි කිසේය යත්? සෙසුසත්වයෝ ඡින්නස්වරහෝ වෙත්. භින්න ස්වරහෝවෙත්.බුදුහුවූකලී මහාබ්‍රහ්මයාගේ ස්වරසදෘශ ස්වරයෙන් යුක්තවනසේකි; බ්‍රහ්මයාගේස්වරය පිත්තශ්ලේෂ්මාදිපරිශුඩ වන බැවින් විශුඩවේ. බුදුන්විසින් කරණලද දානශීලාදි කුශලකර්මය බුදුන්ගේ වස්තුශොධනයකරයි. වස්තුහු සුඩවන බැවින් නාභිය පටන්ගෙණ පහළ වන ස්වරය විශුඩව අෂ්ටාඞ්ගසමන්නාගතව පහළවේ-කුරවි කොවිල්ලන් යඩසෙයින් මධුරවේ;කුරවි කොවිල් ලන් රසඇති විලිකුන් ආමුළු තුඩින්පැහැර සලාපියා එයින් වැහෙන අඹරසබී පක්ෂතාලදී කූල්නාකල්හි චතුෂ්පාදදීහු මධු මදමූදිතයන් සෙයින් ලලිතාරම්භ කෙරෙත්—කෙසේද? ගොචර යෙහ ව්‍යාවෘතනවූ චතුෂ්පාදයෝ මූඛයෙන්ගත් තණකබල හෙලාපියා සිට ඒ හඬඅසත්; සිංහ ව්‍යාඝ්‍රාදී චණ්ඩමෘගයෝ ක්ෂුද්‍ර මෘගයන් ලුහුබඳිනාහු ඔසවාගත් පා බහා නොතබා සිට අසත්; ක්ෂුද්‍රමෘගයෝ මරණ භය හැරසිට අසත්; අහසින්යන පක්ෂීහු පක්ෂප්‍රසාරණනොකොට අසත්, දියෙහි මත්ස්‍යයෝද; කර්ණ

පටල නොසොල්වා සිට අසත්. මෙබඳු කුරවීකනාද ශතභාගයෙන් හෝ සහස්‍රභාගයෙන් හෝ වැඩි මධුරතර ස්වරයෙන් යුක්තවනසේක්; මෙසෙයින් බුදුහු මහාබ්‍රහ්මයාගේ ස්වරසදෘශ ස්වරඇතිවන බැවින් 'බ්‍රහ්මස්වර' නම්වෙත්.

"අභිනීලනෙත්තො" යනතන්හි ඔවුන් අභිනීලනෙත්‍ර පරිදි කිසේද යත්? බුදුන් සියලු නුවන්ම නිල්වන්නේ නොවෙයි. නිල් වූවමනාතන්හි දියමෙරලිය මල්වැනි ඉතා පිරිසිදු නිල්පැහැයවේ; රන්පාට වූවමනාතන්හි කිණිහිරි මල්වැනි ඉතා රන්වන් පැහැයවේ. රත්වූවනාතන්හි බඳුවදමල්වැනි ඉතා රත්පැහැය වේ; සුදුවූවමනා තන්හි දවහත් තරුවැනි ඉතා සුදුපැහැයවේ; කළු වූවමනාතන්හි රුක්පෙණෙල ඇටවැනි ඉතාපිරිසිදු කළු පැහැයවේ. මෙසේ නෙත්‍රයුග්මය රන්විමනෙක්හි නැඹුම්ණි සිහි මැදුරක් සෙයින් වැටහෙයි, මෙසෙයින් අභිනීලවූ නෙත්‍රයන් ඇතිබැවින් 'අභිනීලනෙත්‍ර' නම්වෙත්.

"ගොපඛුමො" යනතන්හි ඔවුන් ගොපක්ෂ්ම ඇතිපරිදි කිසේයයත්? මෙහි 'පක්ෂ්ම' නම් සියලු ඇස්ගුලයයි; ඇස්ගුලය කළුවස්නාට ඝනස්වභාවවේ; රතුවස්නාට විප්‍රසන්නවේ; එබැවින් බුදුන්ට එවිගසඋපන් රතුවස්සක්හුගේ අක්ෂිගුලය සදෘශවූ අක්ෂිගුලයෝ වෙත්; සෙසුසත්වයන්ගේ අක්ෂිගුලයෝ අපරිපූර්ණවෙත්; හස්තිමූෂික කාකාදීන්ගේ ඇස්වැනි නිඝ්නවූ ගම්භීරවූ අක්ෂිගුලයෝ වෙත්; බුදුන්ටවූකල දෙව මැද තුබූ මණිගුලිකාසෙයින් මොලොක් සිනිදු නිල් සියුම් අක්ෂිගුලයෝවෙත්; මෙසෙයින් එවිගස උපන් රතුවස්සක්හුගේ අක්ෂිගුල සදෘශවූ අක්ෂිගුල ඇතිවනබැවින් 'ගොපක්ෂ්ම, නම්වෙත්,

"උණ්ණාභමූකන්තරෙ ජාතා" යනාදිතන්හි 'ඌර්ණා' නම් කවරයත්, ඒ රෝමය බුදුන්ගේ නලල්මැද වූයේයි. ඉතා පිරිසිදුයි; දවහත් තාරකාවවැනි ශ්වයි. පහන්ගිතෙල ගලාතුබූ සියක්වටපෙළු පුලුන් පෙදක්සෙයින් මොලොකි; හිඹුල්පුලුන් ලිය පුලුන් හා සමානයි; ඒ රෝම කෙළවර ගෙණ ඇදිකල්හි අඹබාහු ප්‍රමාණවේ; හැරිකල්හි දක්ෂිණාවර්තවශයෙන් කැරකැවී ඌර්ධවාග්‍රවසිටී. රන්පුවරුවක් මැද තුබූ රිදීබුබුලක්මෙන්ද, රන් කලසකින් නික්මෙන ක්ෂීරධාරාවක් මෙන්ද, අරුණුවන් රශ්මියෙන් රැඳීගිය නභස්තලයෙහි ඔෂධි තාරකාවක් මෙන්ද, ඉතා සිත්කලුව දිලිහේ. මේ 'ඌර්ණාරොම' නම්වේ.

"උණ්හීසසීසො"යන තන්හි ඔවුන් උෂ්ණීෂශීර්ෂපරිදි කිසේය යත්? හේසම්පූර්ණලලාට ඇතිබවද,සම්පූර්ණ ශීර්ෂඇතිබවද, ගෙණ කියනලදී, බුදුන්ගේ දක්ෂිණකර්ණචූලිකායෙහි පටන් ලෙණ

මාංස පටලයෙක් නැගී සියලු නළල වසා පුරාවාමකාණී චූලිකාගෙහි සිටියේයි. රජක්හුගේ නළලෙහි බඳනාලද රන්පටක් සෙයින් දිලිහේ පශ්චිමභවිකවූ බොධිසත්ත්වයන්ගේ මේ ලක්ෂණය දැක රජදරුවන්ට උෂ්ණීෂපට කළාහුයි; නළල්පට කළාහුයි; මේ එක් අර්ථයෙකි. සෙසුසත්වයෝ අපරිපූර්ණවූ ශීර්ෂ ඇතිවෙත්, ඇතම්කෙනෙක් කලපශීර්ෂවෙත්; ඇතම්කෙනෙක් ඵලශීර්ෂවෙත්, ඇතම්කෙනෙක් අස්ථිශීර්ෂවෙත්;ඇතම්කෙනෙක් කුම්භශීර්ෂවෙත්; ඇතම් කෙනෙක් ප්‍රාග්භාරශීර්ෂවෙත්, බුදුන්ටවූකල හිඳි අගින් වටා තුබුවාක්සෙයින් පරිපූර්ණවූ දියබුබුලක්බඳු ශීර්ෂවේ; එහි ප්‍රථමපක්ෂයෙහි උෂ්ණීෂ පටියෙන් වෙළනලද හිසක් වැනි හෙයින් උෂ්ණීෂශීර්ෂ'වී. ද්විතීයපක්ෂයෙහි උෂ්ණීෂපටටයක් සෙයින් හැමතැන්හි පරිමණ්ඩලශීර්ෂය, උෂ්ණීෂශීර්ෂ' නම්වේ. මෙසෙයින් උෂ්ණීෂසදෘශ ශීර්ෂ ඇතිවන බැවින් 'උෂ්ණීෂශීර්ෂ' නම් වෙත්—මෙසේ මෙබඳු ද්වාත්‍රිංශත් මහාපුරුෂ ලක්ෂණයන්ගේ ශොභායෙන් බුදුහු මණිගණප්‍රභා සමුජ්වලිත රත්නාකරයක්හුගේ ශ්‍රීවිභූතිය අභිභවනයකරමින් දිලියෙනසේකි.

41. "මණිගණවිභා සමුජ්ජල
තලස්සරතනාකරස්ස සිරිවිභවන්තං
භගවන්තමභිභවන්තං
වන්දෙ වත්තිංස විමලලක්ඛණ සිරියා"

යනු එහෙයින්ම කියනලදී—මේ"ද්වාත්‍රිංශත් මහාපුරුෂ ලක්ෂණ" නම්වෙත්.

මොහු කවරකාරණයෙකින් 'ලක්ෂණ' නම් වූවාහුද යත්? මේ දෙතිස්මහා පුරුෂලක්ෂණයෙන් සැදුම්ලද බුදුන්ගේ ශරීර සමෘද්ධිය දුටු ලක්ෂණඥ දිගම්බරපරිව්‍රාජක බ්‍රාහ්මණ මාණවකාදීන් විසින් මොහු ඒකාන්තයෙන් සව්නේ ගෙවා දත් බුදුහුමයයි මේ ලක්ෂණ වශයෙන් දත්තාබැවින් 'ලක්ෂණ' නම්"ලක්ෂ-දර්ශනාඞ්කනයෝඃ" යන ධාතුයි. මෙතැන්හි ලක්ෂණශබ්දය චිහ්නයෙහි වැටේ 'චිහ්න' නම් සලකුණයි,

"අශීති අනුව්‍යඤ්ජන" නම් කවරහයත්? චිතඞ්ගුලිතා–අනුපුබ්බඞ්ගුලිතා-වට්ටඞ්ගුලිතා–තම්බනඛතා-තුඞ්ගනඛතා-සිනිද්ධනඛතා

(41) වත්තිංස විමල ලක්ෂණසිරියා, නිර්මලවූ දෙතිස් මහාපුරුෂ ලක්ෂණ ශ්‍රියාවෙන්, මණිගණවිභා, රත්න සමූහදීප්තියෙන්, සමුජ්ජලන්තස්ස, බබලනතල ඇත්තාවූ; රතනාකරස්ස, සාගරයාගේ; සිරිවිභවං, ශ්‍රීවිභූතිය; අභිභවන්තං, අභිභවනය කරන්නාවූ; තං භගවන්තං, ඒ බුදුන්; වන්දෙ, වඳිමි;

නිග්ගුළ්හගොප්ඵකතා — සමපාදතා — ගජසමානක්කමතා — සීහසමානක්කමතා - හංසසමානක්කමතා - උසභසමානක්කමතා - දක්ඛිණාවත්ත ගතිතා සමන්තතො චාරුජාණුමණ්ඩලතා පරිපුණ්ණපුරිසව්‍යඤ්ජනතා - අච්ඡිද්දනාභිතා - ගම්භීරනාභිතා - දක්ඛිණාවත්තනාභිතා — විරදකරසදිසඌරුභුජතා — සුවිභත්තගත්තතා — අනුපුබ්බගත්තතා — මට්ඨගත්තතා — අනුස්සනානනුස්සනසබ්බගත්තතා — අලීනගත්තතා - තිලකාදිරහිතගත්තතා - අනුපුබ්බරුචිරගත්තතා - විසුද්ධගත්තතා - කොටිසහස්සහත්ථිබලධාරණතා - තුඞ්ගනාසතා - සුරත්තද්විජමංසතා - සුද්ධදන්තතා - සිනිද්ධදන්තතා - විසුද්ධින්ද්‍රියතා - වට්ටදඨතා — රත්තොට්ඨතා — ආයතවදනතා — ගම්භීරපාණිලෙඛතා — ආයතලෙඛතා — උජුකලෙඛතා — සුරුචිරසණ්ඨානලෙඛතා — පරිමණ්ඩලකායප්පභාවන්තතා — පරිපුණ්ණකපොලතා — ආයතවිසාලනෙත්තතා — පඤ්චප්පසාදවන්තනෙත්තතා - ආකුඤ්චිතග්ගපඛුමතා - මුදුතනුකරත්තජිව්හතා — ආයතරුචිරකණ්ණතා — නිග්ගණ්ඨිසිරසතා — නිග්ගුළ්හසිරසතා — ඡත්තනිභචාරුසීසතා — ආයතපුථුලලලාටසොභතා — සුසණ්ඨානභමුකතා — සණ්හභමුකතා — අනුලොමභමුකතා — මහන්තභමුකතා — ආයතභමුකතා — සුඛුමාලගත්තතා — අතිවියසොම්මගත්තතා — අතිවියඋජ්ජලිතගත්තතා — විමලගත්තතා — කොමලගත්තතා — සිනිද්ධගත්තතා — සුගන්ධතනුතා — සමලොමතා — කොමලලොමතා — දක්ඛිණාවත්තලොමතා - භින්නඤ්ජනගසදිසනීලලොමතා — සිනිද්ධලොමතා — අතිසුඛුමඅස්සාසපස්සාසධාරණතා — සුගන්ධමුඛතා — සුගන්ධමුද්ධනතා — සුනීලකෙසතා — දක්ඛිණාවත්තකෙසතා — සුසණ්ඨානකෙසතා — සිනිද්ධකෙසතා — සණ්හකෙසතා — අලුලිතකෙසතා — සමකෙසතා - කොමලකෙසතා — කෙතුමාලාරතනඡිතතා"යි.

බුදුහු, මෙබඳු අශීතිඅනුව්‍යඤ්ජනයෙන් බබලන විචිත්‍රලක්ෂණ සම්පත් හා ප්‍රජ්වලිතකෙතුමාලාජාලයෙන් සමුජ්වලිතරූපශොභා ඇතිසේකි.

4. "තමසීතිඅනුබ්‍යඤ්ජන
සමනුබ්‍යඤ්ජිත විචිත්තලක්ඛණවිභවං
පජ්ජලිතකෙතුමාලා
ජාලසමුජ්ජලිතරූපසොභං වන්දෙ"

යනු එහෙයින්ම කියනලදී-මේ "අශීතිඅනුව්‍යඤ්ජන" නම්වේ.

---

(4.) අසීතිඅනුබ්‍යඤ්ජන, අශීත්‍යානුව්‍යඤ්ජනයෙන්; සමනුබ්‍යඤ්ජිත, බබලන්නාවූ; විචිත්ත, විසිතුරුවූ; ලක්ඛණවිභවං, ලක්ෂණ සම්පත්ඇති; පජ්ජලිත, දිලියෙන්නාවූ; කෙතුමාලාජාල, කෙතුමාලාජාලයෙන්; සමුජ්ජලිත, විරාජමානවූ; රූපසොභං, ශරීර සොභාඇති; තං, ඒබුදුන්; වන්දෙ, වඳිමි;

මොහු කවරකාරණයකින් 'අනුව්‍යඤ්ජන' නම් වූ දයත්? මෙකී 'අශීති අනුව්‍යඤ්ජනයෝ' දෙතිස්මහාපුරුෂලක්ෂණ අනුවගොස් ලක්ෂණප්‍රකාශ හා ශරීරසොභාව මොනවට ප්‍රකාශකරණ හෙ, යින් 'අනුබ්‍යඤ්ජන' නම් වෙත්-අනු වි පූර්වවූ "අඤ්ජ-ව්‍යත්තිමක්ඛන ගතිකානතිසු" යන ධාතුයි.

මේ දෙතිස්මහා පුරුෂලක්ෂණ හා අශීත්‍යානුව්‍යඤ්ජනයෙන් යුක්ත හෙයිනුත් 'සුගත' නම් වනාස්කි—තවද, විපුලවිමල කරුණාසමෘති වීර්‍යයාදි ගුණවිශෙෂ සහිතවූ ඥානගමනයෙන් යුක්ත හෙයිනුත් සුගත, නම්වේ

"ලොකවිදූ" යන තන්හි "සංස්කාරලොකය, සත්වලොකය අවකාශලොකය"යි ලොකය ත්‍රිවිධවේ-එහි "එකො ලොකො සබ්බසත්තා ආහාරට්ඨිතිකා. වෙ ලොකා නාමඤ්ච රූපඤ්ච. තයො ලොකා තිස්සො වෙදනා චත්තාරො ලොකා චත්තාරො ආහාරා පඤ්ච ලොකා පඤ්චුපාදානක්ඛන්ධා. ඡ ලොකා ඡ අජ්ඣත්තිකානි ආයතනානි. සත්ත ලොකා සත්ත විඤ්ඤාණට්ඨිතියො. අට්ඨ ලොකා අට්ඨ ලොකධම්මා. නව ලොකා නව සත්තාවාසා. දස ලොකා දසායතනානි. චාදස ලොකා චාදසායතනානි. අට්ඨාරස ලොකා අට්ඨාරස ධාතුයො"යි කියනලද සංස්කාරලොකයෙහි ප්‍රත්‍යයොත්පන්න ඉන්ද්‍රියානින්ද්‍රියප්‍රතිබද්ධ ස්කන්ධයෝ අවිද්‍යාදි ප්‍රත්‍යයන්විසින් අංස්කරණය කරණලදහෙයින් 'සංස්කාර' නමුත්වෙත්. ජරායෙන් අවස්ථාන්තර ප්‍රාප්තීන් යොවුන් නැසීමය යන ලුජ්ජනාර්ථයෙන්ද, මරණින් ජීවිතෙන්ද්‍රියොපච්ඡෙදයයි කියනලද පලුජ්ජනාර්ථයෙන්ද, 'ලොක' නමුත්වේ—ලුජ්ජති පලුජ්ජතීති 'ලොකො' "ලුජ-විනාසෙ" යන ධාතුයි.

"සබ්බසම්පි සත්තානං ආසයං ජානාති, අනුසයං ජානාති, චරිතං ජානාති, අධිමුත්තිං ජානාති, අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ"යි කියනලද ඉන්ද්‍රිය ප්‍රතිබද්ධ ස්කන්ධයන්ගේ සමූහසන්තාන දෙක රූපාදි අරමුණෙහි සක්තවප්‍රවෘත්තා හෙයින් 'සත්ව නමුත්වේ; අනුමානවශයෙන් කුශලාකුශලයද, ප්‍රත්‍යක්ෂවශයෙන් එහි ඉෂ්ටානිෂ්ටවිපාකයද, මෙහි සිට බලනා හෙයින් 'ලොක' නමුත්වේ—ලොකයති එත්ථ සුභාසුභං තප්ඵලඤ්චාති ලොකො "ලොක-ලොචන-දස්සනෙ" යන ධාතුයි.

"යාවතා චන්දිමසුරියා පරිහරන්ති දිසා භන්ති විරොචනා" නාදීන් දක්වනලද අයමින් විතරින් දෙලොස්ලක්ෂ තුන්දහස් සාරසීයපනස්යොදුන් පමණඇතිවටින් සතිස් ලක්ෂ දසදහස්

තුන්සියපනස් යොදුන් පමණඇති චක්‍රවාටය, දෙලක්‍ෂ සතලිස් දහසක් යොදුන් පමණ බොලඇති මහපස්පොළොවය, ඒ පස් පොළොව දරූ සාරලක්‍ෂ අසූදහසක් පමණ යොදුන් බොලඇති දියපොළොවය, ඒදියපොළොව දරූ නවලක්‍ෂසැටදහසක් යොදුන් පමණ බොල ඇති වාපොළොවය, මෙසේ සිටි මෙලොව සුවාසූදහසක් යොදුන් පමණ සාගරයෙහි ගැලී සිටි සුවාසූදහසක් පමණ නැගීසිටි මහාමේරුපර්වතය, ඒ මහමෙරට අර්ධාර්ධ ප්‍රමාණයෙන් සමුද්‍රයෙහි ගැලී නැගී සිටි දෙවයක්‍ෂවාසවූ නානාවිධ රත්නයෙන් විචිත්‍රවූ යුගන්ධර ඊෂධර කරවීක සුදර්ශන නෙමින්ධර විනතකාදිසප්තකුල පර්වතයෝය, පන්සියයක් යොදුන් පමණ උසඇතිඅයමින් විතරින් තුන්දහසක් යොදුන් පමණ ඇති සුදර්ශන චිත්‍රකූටකෛලාසකූට යනාදි සුවාසූදහසක් කූටයෙන් ප්‍රතිමණ්ඩිත හිමාලයපර්වතය, මෙම දඹදිවට සලකුණුවූ මූලසිට වෙළප පනස්යොදුනක් පමණඇති එසේම පනස් පනස් යොදුන් පමණ ඇතිවූ පඤ්චමහාශාඛාවන් ඇති සියක් යොදුන් පමණ විස්තෘරොනෙසධඇති සිසාරා තුන්සියක් යොදුන් පමණ ඇති මහාජම්බුවෘක්‍ෂය, දෙයාසූදහසක් යොදුන් පමණ සාගරයෙහි ගැලී සිටි දෙයාසූදහසක් පමණ නැගී සිටි සක්වළ ගලය, අයමින් විතරින් උසින් එකුන්පනස් යොදුන් සඳමඬලය, සම පනස් යොදුන් හිරමඬලය, දසදහසක් යොදුන් පමණඇති සක් දෙව්රජහට නිවාසස්ථානවූ තව්තිසාභවනය, එසේ දසදහසක් යොදුන් පමණඇති අසුරභවනය හා අවීචිමහා නරකය හා ජම්බුද්වීපය, සත්දහසක් යොදුන් පමණඇති අපරගොයානයහා පූර්වවිදෙහය, අටදහසක් යොදුන් පමණඇති උතුරුකුරු දිවයිනය, යන ක්‍ෂුද්‍රද්වීප පන්සියක් පන්සියක් පිරිවරකොටඇති සතරමහාද්වීපය; යනාදිවශයෙන් අනන්තාපරිමාණ ලොකධාතු යයි කියනලද අනින්ද්‍රියප්‍රතිබද්ධ රූපයන්ගේ සමූහ සන්තාන දෙක ජඞ්ගමස්ථාවර වස්තු එහි දෙනෙතබැවින් 'ලොක'නමුත් වේ; උන්ට අවකාශවූහෙයින් 'අවකාශ' නමුත්වේ.

බුදුහු මේ යථොක්තවූ ලොකත්‍රය ක්‍රමයෙන් ස්වලක්‍ෂණ සාමාන්‍යලක්‍ෂණයෙන් කුශලාකුශලාදීන් හෙත්වාදීන්ද, ආශයානුශය චරිතාධිමුක්ති අල්පරජස්ක මහාරජස්කාදි වශයෙන්ද, ප්‍රමාණ සංස්ථානාදි ප්‍රභෙදයෙන්ද, සර්වප්‍රකාරයෙන් අවබොධ කළසේක. එහෙයින් "සබ්බථාපි විදිතලොකත්තා ලොකවිදූ" යන මේ අර්ථයෙන් 'ලොකවිදූ' නම් වනසේක. "ලොකං විදතීති ලොකවිදූ" විතියා තත්පුරුෂයයි 'ලොකං' යන විතීයාන්තොපපදවූ "විද-ඤාණෙ" යන ධාතුහුකෙරෙන් ක්විප් ක්‍රමයෙන් සිඬයි.

“අනුත්තරෝ” යනතන්හි ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්ති ඥානදර්ශනාදිවූ ගුණවිශේෂයෙන් ආත්මසදෘශාධික පුද්ගලාන්තර යක්හු නැතිබැවින් “නත්ථිඋත්තරෝ එතස්ස” යන වාක්‍යයෙහි නඤ්සමාස ගර්භකොටඇති බහුව්‍රීහි සමාස වශයෙන් බුදුහු ‘අනුත්තර’ නම් වනසේක.

“පුරිසදම්මසාරථි” යනතන්හි දම්‍යයහයි කියනලද අපලාල නාගරාජ චූලෝදර මහෝදර අග්නිශිඛ ධූමශිඛ ධනපාලාදිවූ තිරශ්චීන පුරුෂයන්ද, සච්චක නිගණ්ඨපුත්‍ර අම්බට්ඨමාණවක පුෂ්කරසාති සොනදණ්ඩ කූටදන්ත ඝොටමුඛ උපාලිගෘහපති ආදිවූ මනුෂ්‍යපුරුෂයන්ද, ආලවක සූචිරෝම ඛරරෝම යක්ෂ ශක්‍රදේවරාජ බකබ්‍රහ්මාදිවූ අමනුෂ්‍යපුරුෂයන්ද, යන කායවාක් සමාදානාදියෙහි යෙදියයුතුවූ පුරුෂයන් සුදුසු සුදුසු පරිද්දෙන් තදඞ්ග විනයාදියෙහි පිහිටුවනහෙයින් “පුරිසදම්මෙ සාරෙතීති පුරිසදම්මසාරථි” යන තත්පුරුෂ සමාසයෙන් හා සෘවිධික්‍රමයෙන් බුදුහු “පුරිසදම්මසාරථි” නම්වනසේකි-නොහොත්-“අනුත්තරෝ පුරිසදම්මසාරථි” යනු එකම අර්ථපදයෙකි; මෙයින් බුදුන්ගේ අනන්‍යසාධාරණවූ පුරිසදම්මසාරථි භාවය දක්වනලදී— කෙසේද? මේ ලෝකයෙහි හස්තිදමක අශ්වදමකාදීන් විසින් දමනලද හික්මවනලද හස්ත්‍යශ්වාදීහු පෞරස්ත්‍යාදි අටදිගුන් අතුරෙන් එකවිටෙක එක දිශාවකටම දිවෙත්, බුදුන්විසින් දමිත පුරිසදම්මයෝ වනාහි නිෂද්‍ය සඞ්ඛ්‍යාතවූ එකම ඊර්‍ය්‍යාපථයකින් නිදර්ශිත මාත්‍රවූ රූපාරූප අෂ්ටසමාපත්ති නමැති අටදිගට ලෞකික පෘථග්ජනයන්විසින් ස්වප්නයෙනුදු අගත පූර්වවූ නිරෝධසමාපත්තියයි කියනලද නිවන් නමැති දිගට ධාවනය කෙරෙත්; එහෙයින් “අනුත්තරෝ ච සො පුරිසදම්ම සාරථි චාති අනුත්තරෝ පුරිසදම්මසාරථි” යන කර්මධාරය සමාසවශයෙන් බුදුහු ‘අනුත්තරපුරිසදම්මසාරථි’ නම් වනසේකි—මාතුපිතුනනං හදයං පූරෙන්තීති පූරි “පූරතිමාකිසොරසොාච” යන ණ්වාදි සූත්‍රයෙන් “පූර-පූරණෙ” යන ධාතුහුකෙරෙන් විහිතකිසප්‍රත්‍යය හා ධාතු ඌකාරයහට හ්‍රස්වකිරීමෙන්‘පුරිස’ශබ්දසිද්ධිය දතයුතු.

‘දමිතබ්බාදම්මා’ “දම-දමනෙ” යන ධාතුහුකෙරෙන් විහිත කෘදන්තප්‍රත්‍යයෙන් සිද්ධයි“පුරිසා ච තෙ දම්මා චෙති පුරිසදම්මා-සාරෙතීති සාරථි”-සාරෙතීති, පදීනුයි පවත්වානුයි; සාරථි, සාරථි නම්වේ-“සාරිසමාරථි” යන ණ්වාදිසූත්‍රයෙන් “සර-ගතිහිංසාචි න්තාසු” යන ධාතුහුකෙරෙන් විහිතරථි ප්‍රත්‍යයෙන් සාරථි ශබ්දයාගේ පදසිද්ධිය දතයුතුයි‘පුරිසදම්ම සාරෙතීති පුරිසදම්මසාරථි’

පුරිසදම්මෙ, දමියයුතු මිනුෂ්‍යාමනුෂ්‍යතිරශ්චීනපුරුෂයන්; සාරෙතීති, දමානුයි හික්මවානුයි; පුරිසදම්මසාරථි, පුරිසදම්මසාරථි නම්වේ; දමියයුතු සත්‍වයන් ඇතද උත්තමවශයෙන්‘ පුරිසදම්මසාරථි,යි කීහු. එක්සමයෙක්හි කෙසිනම් අශ්වදම්‍යසාරථියෙක් බුදුන්කරාඑළඹනමස්කාරකොටඑකත්පස්වහුනි. එකල්හිබුදුහුඕහට, කෙසියතෝ ප්‍රසිද්ධඅශ්වදම්‍යසාරථියෙහිය,එබඳුවූතෝඅසුන් කෙතෙක්ප්‍රකාරයකින්විනයනයකෙරෙහිදැයි? විචාරාවදාළසේකි ස්වාමීනි සර්වඥයන්වහන්ස, මම් අශ්වයන්ශලක්ෂණයෙනුදු විනයනයකෙරෙමි,පරුෂයෙනුදුවිනයනයකෙරෙමි, ශලක්ෂණපරුෂයෙනුදු විනයනය කෙරෙමියිදැන්වී. කෙසිය මේතුන්ප්‍රකාරයෙන් නොහික්මෙන අශ්වයන්ට තෝ කුමක් කෙරෙහිදැයි? වදාළසේකි; ස්වාමීනිබුදුරජානන්වහන්ස’ මාගේආචාර්‍ය්‍යකුලයට අකීර්ත්තිනොවනුයදහා ඔවුන් මරම්යි දැන්වී; මෙසේ දන්වා ඉක්බිති වහන්ස නුඹවහන්සේ, නිරුත්තර පුරුසදම්මසාරථි,වනසේක .එබඳුනුඹවහන්සේසත්‍වයන් කෙතෙක්ප්‍රකාරයකින් විනයනයකරණසේක්දැයි?විචාළේය; බුදුහුඑවිට ඕහටකෙසිය මම්සත්‍වයන්ශලක්ෂණයෙනුත් විනයනය කෙරෙමි; පරුෂයෙනුත්විනයනයකෙරෙමි; ශලක්ෂණපරුෂයෙනුත්විනයනයකෙරෙමියිවදාළසේකි-එහි, ශලක්ෂණනම්“සුචරිතමෙසේය, සුචරිතඵලමෙසේය, ස්වර්ගලොකමෙසේය” යන මෘදු දෙශනායි-‘පරුෂ’නම්“දුශ්චරිත මෙසේය,දුශ්චරිතඵල මෙසේය, අපායලොකමෙසේය” යන කර්කශදෙශනායි-‘ශලක්ෂණපරුෂ’නම් මේදෙකින් ව්‍යාමිශ්‍රදෙශනායි-එකල්හි ඒ කෙසීනම් අස්දම් සැරියතම මේ තුන්ප්‍රකාරයෙන් විනයනය නොවනසත්‍වයන්ට කුමක්කරණසේක්දැයි? විචාළේය; කෙසිය ඔවුන් මරමියි වදාළසේක; තමන්වහන්සේට ප්‍රාණවධ නුසුදුසුවේදැයි? කී. කෙසිය ඒ සැබව,මටප්‍රාණවධ නුසුදුසුය, එහෙයින් මරමියි මා කීවචනය අනිකෙක, වචනාර්ථයඅනිකෙක, යමෙක්සරාග සවෙෂාදිෂොඩශාකාරයෙන් ආශයානුශයාදි බැලූකල මේතුනින්එක්තරාප්‍රකාරයෙකිනුත්විනයනයනොවේනම් නොහික්මේනම්හේමාවිසින් අනුශාසනා කටයුතුනොවෙයි, ඒ ඕහට වධයයි වදාළසේකි. මේ කාරණයෙනුත් බුදුහු ‘අනුත්තරපුරිසදම්මසාරථි’ නම් වන්සේකි.

“සත්ථා දෙවමනුස්සානං”යනතන්හි“දිට්ඨධම්මික සම්පරායිකපරමත්ථෙහියථාරහං අනුසාසතීති සත්ථා”යනුහෙයින් බුදුහුඋත්කෘෂ්ටසත්‍ව භව්‍යපුද්ගල පරිච්ඡෙදවශයෙන් දිව්‍යමනුෂ්‍යයන්ට “ඓහිකාමුෂ්මිකපරමපුරුෂාර්ථය”යනමෙයින්හෙවත්මෙලෝපරලෝ

හිතයෙන්ද, නිර්‍යාණයෙන්ද, සුදුසුසුදුසුපරිද්දෙන් අනුශාසනාකර ණහෙයින් 'ශාස්තෘ' නම්වනසේක. මෙහි 'අනුශාසනා' නම් ඒ ඒ අර්ථයෙහි ඒඒවැඩෙහිපිහිටුවීමයි–නොහොත් "සත්ථවාහොතිසත්ථා" යනමේ අර්ථයෙන්ද, බුදුහු ජඞ්ඝසාර්ථශකටසාර්ථ නායකයාවැනිහෙයිනුත් නෛරුක්තිකවිධීන් 'ශාස්තෘ' නම්වනසේක, යම්සේ ජඞ්ඝසාර්ථ ශකටසාර්ථ නායකතෙම සත්වාමූල "චෞරකාන්තාරය, ව්‍යාලකාන්තාරය, අමනුෂ්‍යකාන්තාරය, නිරුදකකාන්තාරය, අල්පභක්‍ෂ්‍යකාන්තාරය" යනමේ පඤ්චප්‍රකාර කාන්තාරයන් අතික්‍රමණය කොටනිරුපද්‍රවස්ථානයටපමුණුවාද, එපරිද්දෙන්බුදුහුජාතිජරාමරණ නැමැති මහකතරින් එතරකොට නිවන්නැමැති ශාන්ති පුරයට පමුණුවන සේක.

"දෙවමනුස්සානං" යනමේ පදය උත්තම සත්වපරිච්ඡේද වශයෙන්ද, මාර්ගාධිගමයටයොග්‍යපුද්ගලපරිච්ඡේදවශයෙන්ද, කියනලදී. එහෙයින්බුදුහුතිරශ්චීනයන්ටත් අනුශාසනාකිරීමෙන් 'ශාස්තෘ' වනසේකි තිරශ්චීනයෝත් බුදුන් අතින් බණ ඇසීමෙන් ත්‍රිහේතුක ප්‍රතිසන්ධිආදිවූමාර්ගඵලාධිගමයට බලකාරණලදින් දෙවැනිතුන්වැනිආත්මභාවයෙහි මාර්ගඵලයටහිමිවෙත්–ඒමෙසේයි.

එක්සමයෙක්හි අපබුදුන් ගර්ගරානම් රාජමහෙසිකාවවිසින් ඛනනයකරවූහෙයින් 'ගර්ගරා' නම්වූපුෂ්කරණීතීරයෙහි ප්‍රඥප්තාසනයෙහි වැඩහිඳ චම්පානුවරවාසීන්ට ධර්මදේශනා කරණකල්හි එහිවසන එක්මණ්ඩුකයෙක් බුදුන්ගේ ශබ්දයෙහි මේ කියන්නේ බණකැයිධර්මසංඥයෙන්ප්‍රසන්නචිත්තයෙන්නිමිත්තග්‍රහණයකොළේ, මෙහි 'නිමිත්තග්‍රහණය' නම් මත්තෙහි ලැබියයුතු ලෞකික ලෝකොත්තරසම්පත්තියටකාරණවූබුද්ධවචනග්‍රහණයයි. එකල්හි එක් වස්සන් රකිනා ගොපල්ලෙක් එතැන්හි දණ්ඩක එල්බ සිටිනේ ඒ මණ්ඩුකයාගේඉස ඔබාගණ සිටීය, එකල්හි ඒ මණ්ඩුකයා ඒදුඃඛයෙන් එවිටමකාලක්‍රියාකොට තුන්කෙළසැටලක්‍ෂයටආයු ඇතිතව්තිසාදිව්‍යලොකයෙහි නිදාපිබිදියක්හුමෙන්දොළොස්යොදුන්පමණඋසඇති රන්විමනෙක ඖපපාතිකවඋපති; එතෙමඑහි දහස්ගණන්දෙවඟනන්විසින්පිරිවරණලදතමාබලාකොලම්මත් මෙසේවූ තැනකඋපන්මි. මිටහේතූ කවරනම්කුශලකර්මයක්කොළෙම්දෝහොයි ආභොගකරන්නේදිවසින් පරීක්‍ෂාකොට බලන්නේ බුදුවදන්හිකළ නිමිත්තග්‍රහණයවිනාඅන් වෙනින් කළකුසලක්නොදිටි. ඒදිව්‍යපුත්‍රතෙම එවිගසම් දිව්‍යප්සරා සමූහයාවිසින් පිරිවරණලදුව දොළොස්යොදුන් රන්විමන හා සමඟ බුදුන්කරා

එළඹ ශ්‍රීපාදයට නමස්කාර කෙළේය, එකල්හි බුදුහු ඔහුදැන වදාරණසේක්ම එතැන්හි රැස්වූ පර්ෂදට ධර්මශ්‍රවණමය කුශලයෙන් ජනිත ඉෂ්ටවිපාක ඔහු ලවාම ප්‍රකාශකරවනු පිණිස.

46 "කො මෙ වන්දති පාදානි-ඉද්ධියා යසසා ජලං
අභික්කන්තෙන වණ්ණෙන-සබ්බා ඔභාසයං දිසා"

යනමේගාථාවෙන් දෙවසෘද්ධියෙන්ද, දිව්‍ය ඓශ්වර්‍ය්‍යයෙන්ද මෙබඳු පරිවාරයෙන්ද, දිලියෙමින් ඉතා යහපත්වූ ශරීරවර්ණයෙන් සියලු පූර්වාදි දසදිගුන් හිරුසේ සඳසේ එකොභාස එකාලෝක කෙරෙමින් අවුත් මාගේ පාදයන් කවරෙක් වඳනේදැයි? වදාළසේක. හෙතෙම එවිට.

47 "මණ්ඩූකො 'හං පුරෙ ආසිං-උදකෙ වාරිගොචරො
තව ධම්මං සුණන්තස්ස-අවධී වච්ඡපාලකො"

යන මේගාථාවෙන් දියෙහි දියම ගොදුරු කොටඇති පෙර මම මණ්ඩූකයෙක් වීමි; ස්වාමීනි බුදුරජාණන්වහන්ස නුඹවහන්සේගේ මේබණඅසන මාඑක්වසු ගොපොල්ලෙක් දණ්ඩකින්මැඩ මැරූයේයයිදැන්වී; බුදුහුඑවිටඔහටධර්මදෙශනාකොටවදාළසේකි ඒධර්මදෙශනාවෙන් එතැන්රැස්වූසුවාසූදහසක් ප්‍රාණීන්ට චතුස්සත්‍යප්‍රතිවෙධයවිය; මාර්ගඵලාධිගමයවිය; ඒ මණ්ඩූක දිව්‍යපුත්‍රද දහසක්නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලයෙහි පිහිටා එසේම ඉතාමඳවූ කුසලානුභාවයෙන් මෙසේ ඉතා මහත්වූ ලොව්ලොවුතුරාසැපත් ලැබෙන්නේයයි කියා උපන් ප්‍රීති සොම්නසින්ඝනා පහළකොට.

---

(46) ඉද්ධියං, දෙවසෘද්ධියෙන්ද; යසසා, යසසින්ද; ජලං, දිලිසෙන්නාවූ; අභික්කන්තෙන, ඉතා සිත්කළුවූ; වණ්ණෙන, ශරීර වර්ණයෙන්, සබ්බාදිසා,සියළුදිගුන්,ඔභාසයං,බබුළුවන්නාවූ;කො, කවරෙක් තෙම; මෙ, මාගේ; පාදානි,පාදයන්; වන්දති,නමස්කාර කෙරේද;

(47)පුරෙ,පූර්වයෙහි;අහං,මම;උදකෙ,ජලයෙහි,වාරිගොචරො, දියගොදුරුකොටඇති;මණ්ඩූකොආසිං,මැඩියෙක්වීමි; (ස්වාමීනි) තව, නුඹවහන්සේගේ; ධම්මං, ධර්මය; සුණන්තස්ස, (මණ්ඩූකභාවයෙන්,ශ්‍රවණය කරන්නා, වච්ඡපාලකො,(එක්)වසුගොපල්ලෙක්, අවධී, වධප්‍රාප්ත කෙළේයි; (මැරීයිසේයි)

48 “මුහුත්තං චිත්තප්පසාදස්ස-ඉද්ධිං පස්ස යසඤ්ච මේ
ආනුභාවඤ්ච මෙ පස්ස-වණ්ණ මප ස්සජුතිඤ්ච මෙ-
49 යෙ ච තෙ දීඝමද්ධානං-ධම්මං අස්සොසුං ගොතම
පත්තා තෙ අචලං ඨානං=යත්ථ ගන්ත්වා න සොචරෙ

යන මේ ගාථා දෙකින් බුදුන්ට ස්තුති කොට තමාගේ දිව්‍ය ලෝකයට ගියේය-එසේහෙයින් බුදුහු තිරශ්චීනයන්ටත් ශාස්තෘ වනසේකි—“අනුසාසන්ති සත්ථා,,—අනුසාසන්තීති, අනුශාසනාකො රෙත්තුයි හෙවත් ඒ ඒ අර්ථයෙහි ඒ ඒ වැඩෙහි පිහිටුවාතුයි; සත්ථා ශාස්තෘ නම් වෙයි;මෙහි‘අනුශාසනා, නම් සත්වයන් ඉහලෝක පර ලෝක දෙකින් වන ඒ ඒ වැඩෙහි පිටුවීමයි- නොහොත්—“අත්ථෙන සහ වත්තතීති සත්ථො,,-අත්ථෙන සහ, අර්ථසඞ්ඛ්‍යාතවූධනයහා සමග; වත්තතීති පවතීතුයි;සත්ථො,සාර්ථ නම්වේ-හේ කවරේක්ද? බඩුමිලගෙණ වෙළඳාම්පිණිස දෙශාන්තරයටයන වණිග්ජන සමූහයි; මේ‘තද්ගුණ සංවිඥාන බහුබ්‍රීහිසමාස’යි--“සොඑතස්සඅත්ථීති සත්ථො”—සො,හිතොපදෙශාදි වශයෙන් රක්ෂාකටයුතුවූ අනුශාසනාකටයුතුවූ ඒ වෙළඳමූල; එතස්ස අත්ථිති, මොහට ඇත්තුයි; සත්ථො සාර්ථනම්වේ—හේ කවරෙක්ද? ජඞ්ඝසාර්ථ ශකටසාර්ථනායකයි; මේ ‘අස්ත්‍යර්ථතද්ධිත,යි- “සත්ථොවියාතිසත්ථා”-සත්ථා වියාති ජඞ්ඝසාර්ථ ශකටසාර්ථ නායකයා වැනිතුයි;සත්ථා,උපචාරවශයෙන් බුදුහු ශාස්තෘ නම් වනසේකි—“අතත්සවභාවෙ තත්සවභාවාරොපණමුපචාරඃ”යි-“කංතාරෙන්ති එත්ථාති කන්තාරො”—කං ජලය; එත්ථ, මෙහිලා; තාරෙන්තීති,ගෙණයෙත්තුයි;කන්තාරො, කාන්තාරනම්වේ- හේකවරේද? නිරුදකවූ අරණ්‍යප්‍රදෙශයයි

---

(48) මුහුත්තං, මොහොතක්; චිත්තප්පසාදස්ස,(ධර්මයකෙරෙහි) සිතපැහැදීම හේතුකොටගෙණ; මෙ, මාගේ; ඉද්ධිං, දෙවසෘද්ධියද, යසඤ්ච,ඓශ්වර්‍ය්‍යයද;පස්සබ.ළුවමැනව;මෙ,මාගේ;ආනුභාවඤ්ච, ආනුභාවයද; පස්ස, බැළුවමැනව; මෙ, මාගේ; වණ්ණං, ශරීරවර්ණයද; ජුතිඤ්ච, දිප්තියද; පස්ස, බැළුවමැනව.

(49) ගොතම, ගෞතමසර්වඥයන්වහන්ස; යෙචතෙ, යම්ජ්ජන කෙනෙක්; දීඝ මද්ධානං, දීර්ඝකාලයක් මුළුල්లෙහි; ධම්මං, ධර්මය; අස්සොසුං, ශ්‍රවණය කළාහුද; තෙ, ඔව්හු; යත්ථ, යම්තෙනකට; ගන්ත්වා,ගොස්; නසොචරෙ,(සත්වයෝ)සොකනොකරද්ද; අචලං, ඨානං, (එබඳු) නිශ්චලස්ථානයට; පත්තා, ප්‍රාප්තවූවාහුවෙති.

මෙයින් පිටත් සෙසු සජල අරණ්‍යප්‍රදේශයෝද; රූඪිවශයෙන් කාන්තාරයයි කියනුලැබේ.

“බුද්ධො” යන තන්හි බුදුහු චතුස්සත්‍යය තමන්වහන්සේ ප්‍රතිවේධ කල හෙයිනුත් අනුන්ලවා ප්‍රතිවේධකරවූ හෙයිනුත් ‘බුද්ධ, නම් වනසේකි

මෙහි “චතුස්සත්‍යය නම් “දුඃඛසත්‍යය” සමුදයසත්‍යය, නිරොධසත්‍යය, මාර්ගසත්‍යය,යන මේ සතරයි; මොවුන්අතුරෙන් “ඉදං ඛොපන භික්ඛවෙ දුක්ඛං අරියසච්චං ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛා මරණම්පි දුක්ඛං අප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො දුක්ඛො යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා” යනාදීන් දක්වන ලද්දේ “දුඃඛසත්‍ය” නම්වේ;...... තවද, චුතියෙන් ප්‍රතිසන්ධියට ගොස් ප්‍රතිසන්ධියෙන් චුතියට ගොස්සවර්ගයෙන්අපායගාමීවඅවීචියෙහි පටන් භවාග්‍රය දක්වා භවාග්‍රය පටන් අවීචිය දක්වා සසර අනන්තාපරියන්තවූ ලොකධාතුයෙහි අවිද්‍යාමය නාභිඇති ජරාමරණ නමැති නිම්වළලු ඇති අවිඥත පූර්වකොටිඇති සංස්කාර විඥාන නාමරූප ෂඩායතන ස්පර්ශ වේදනා තෘෂ්ණා උපාදාන භව ජාතිනමැතිදැවිඇතිසංසාර චක්‍රයෙහිපරිභ්‍රමණයකරන්නාවූ සියලුසත්වයන් විසින් අනුභව කටයුතුවූ ජාතිජරාමරණාදිවූ සංසාරව්‍යසනයම “දුඃඛසත්‍ය” නම්වේ

“ඉදං ඛොපනභික්ඛවෙදුක්ඛසමුදයංඅරියසච්චංයායංතණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී-සෙය්‍යථිදං, කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා” යනාදීන් දක්වනලද අචෙතනික සචෙතනික වස්තුවිෂයෙහිවූ කාමතෘෂ්ණාදිවශයෙන් ත්‍රිවිධවූ ආධ්‍යාත්මික බාහ්‍ය අතීතානාගතවර්තමාන කාලෂඩාලම්බන භෙදයෙන් අෂ්ටෝත්තර ශතප්‍රභෙදවූ තෘෂ්ණාවම “සමුදය සත්‍ය නම්වේ.

“ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛනිරොධං අරියසච්චං යො තස්සා යෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො” යනාදීන් දක්වනලද “ශීලවිශුද්ධි, චිත්ත විශුද්ධි, දෘෂ්ටිවිශුද්ධි, කාංක්ෂාවිතරණවිශුද්ධි, මාර්ගාමාර්ගඥානදර්ශනවිශුද්ධි ප්‍රතිපදාඥානදර්ශනවිශුද්ධි,, ඥානදර්ශනවිශුද්ධි” යනසප්තවිශුද්ධි පරම්පරායෙන්ප්‍රත්‍යක්ෂකටයුතුවූ “ශ්‍රොතාපත්තිමාර්ගය’ ශ්‍රොතාපත්ති ඵලය, සකෘදාගාමිමාර්ගය, සකෘදාගාමිඵලය, අනාගාමිමාර්ගය, අනාගාමිඵලය, අර්හත්මාර්ගය, අර්හත්ඵලය” යන මේ අෂ්ටවිධ ලෝ

කොත්තර ධර්මයන්කෙරෙහි නවවැනිව පරියන්තවූ මාරපරාජය කොට ත්‍රිවිධබොධි සමධිගමකළ බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ ශ්‍රාවකයන් විසින් සාක්ෂාත් කළාවූ ශාන්තා ජරාමරාමෘත මහානිර්වාණයම නිරොධ සත්‍ය නම් වේ.

"ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛනිරොධගාමිනී පටිපදා අරිය සච්චං අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථිදං, සම්මා දිට්ඨි, සම්මාසංකප්පො, සම්මාවාචා, සම්මාකම්මන්තො, සම්මා ආජීවො, සම්මාවායාමො, සම්මාසති, සම්මාසමාධි' යනාදීන් දක්වන ලද මධ්‍යම ප්‍රතිපත්තියෙන් යුක්තවූ අෂ්ටාඞ්ගිකමාර්ගයම "මාර්ග සත්‍ය' නම්වේ.

දුඃඛසත්‍යයෙහි 'දු' ශබ්දය කුත්සිතාර්ථයෙහිවැටේ 'ඛ, ශබ්දය තුච්ඡාර්ථයෙහි වැටේ-පළමුවන සත්‍යය අනෙකොපද්‍රවාධිෂ්ඨාන වනබැවින් කුත්සිතයි; බාලජන පරිකල්පිත නිත්‍ය ශුභ සුඛාත්ම භාව රහිත වනබැවින් තුච්ඡයි; මෙසේ කුත්සිත වනබැවින් තුච්ඡ වනබැවින් 'දුඃඛ' වේ-සමුදයසත්‍යයෙහි'සං, යනු සංයොග යෙහි වැටේ 'උ' යනු උත්පත්තියෙහි වැටේ 'අය' ශබ්ද කාරණ යෙහි වැටේ. මෙසේ දෙවන සත්‍යය ප්‍රත්‍යයසමායොගයක් ඇති කල්හි දුඃඛොත්පත්තියට කාරණවනබැවින් "සමුදය"වේ-නිරොධසත්‍යයෙහි 'නි' ශබ්ද අභාවයෙහි වැටේ 'රොධ' ශබ්ද චාරක යෙහි වැටේ, 'චාරක' නම් දඟගෙයයි; මෙසේ තුන්වන සත්‍යය සර්වගති ශූන්‍යවනබැවින්සංසාර චාරක සඞ්ඛ්‍යාතවූ දුඃඛරොධයා ගේ අභාවයහෙයින් "නිරොධ" වේ—දුඃඛනිරොධයට පමුණුවන ප්‍රතිපත්ති ආලම්බනවශයෙන්තදභිමුඛීභූතවනබැවින්"මාර්ග"වේ.

මෙහි භවසුඛාස්වාදග්‍රථිත සත්වයන්ටසංවෙග උපදවනුසඳහා පළමුකොට 'දුඃඛසත්‍යය' දෙශිතය. ඒ දුඃඛසත්‍යයට ප්‍රභවහෙතු දක්වනු සඳහා තදනන්තරකොට 'සමුදයසත්‍යය' දෙශිතය ඊට ඉක්බිති සහෙතුක දුක්ඛයෙන් අභිභූත වනබැවින් කලකිරුණු සිත්ඇති ජනයන්ට නිස්සරණ දර්ශනයෙන් ආස්වාද උපදවනු සඳහා'නිරොධසත්‍යය'දෙසිතය. ඊට ඉක්බිති නිරොධාධිගම සඳහා නිරොධ සම්ප්‍රාපක 'මාර්ගසත්‍යය' දෙසිතයි.

භාරයක්සෙයින්'දුඃඛසත්‍යය'දතයුතුය. භාරාදානයක්සෙයින් සමුදයසත්‍යය' දතයුතුය. භාරනික්ෂෙපණයක් සෙයින්' නිරොධ සත්‍යය' දතයුතුය. භාරනික්ෂෙපණොපායසෙයින් 'මාර්ගසත්‍යය' දත යුතුයි.

මේ යථොක්තවූ චතුස්සත්‍යයෙහි “මේ දුඃඛය, මේ සමුදය, මේ නිරොධය, මේ මාර්ගය”යි උපදනා ඥානය ‘සත්‍යඥාන” නම් වෙයි. මේ එක්පරිවර්තනයෙක. ආකාරවශයෙන් සතරෙක්වේ “දුඃඛය පරිඥෙයය, සමුදය ප්‍රහාතව්‍යය, නිරොධය සාක්ෂාත් කටයුතුය, මාර්ගය වැඩියයුතුය”යි උපදනානුවණ ‘කෘත්‍යඥාන’ නම් වෙයි. මේඑක්පරිවර්තියෙක. ආකාරවිසින් සතරෙක් වේ “දුඃඛය පරිඥාතය, සමුදය ප්‍රහීණය, නිරොධය සාක්ෂාත්කෘතය, මාර්ගය භාවිතාය”යි උපදනා නුවණ “කෘතඥාන’ නම්වෙයි. මේ එක්පරිවර්තියෙක. ආකාරවිසින් සතරෙක් වේ.

මේ චතුස්සත්‍යයෝ යථාක්‍රමයෙන් ප්‍රවෘත්ති ප්‍රවෘත්තිහෙතු නිවෘත්ති නිවෘත්තිහෙතුවශයෙන් දක්නාලද බාධන ප්‍රභවශාන්ති නිර්‍යාණප්‍රකාර තථ්‍යාවිපරීතභාවයෙන් ආර්‍යඥානයට ගොචර වනහෙයින් ‘චතුරාර්‍යසත්‍ය’ නම්වෙත්; බුදුහු මේචතුරාර්‍යසත්‍යයන් තමන්වහන්සේ ශ්‍රීමහාබොධිද්‍රැම මූලයෙහිදී අවබොධකළ හෙයිනුත් පශ්චාද්භාගයෙහි වෛනෙයජනයන්ට අවබොධකරවූ හෙයිනුත් ‘බුද්ධ’ නම් වනසේකි.

“භගවා” යන තන්හි.

* “භාග්‍යවා භග්ගවා යුත්තො–භගෙහි ච විභත්තවා
භත්තවා වන්තගමනො–භවෙසු භගවා තතො”

යනුහෙයින් බුදුහු ලෞකික ලොකොත්තර හිත සුඛාභි නිර්වර්තක දානශීලාදි පාරප්‍රාප්ත භාග්‍යයෙන් යුක්ත බැවින් “භාග්‍යමස්සාසන්ති” යන වාක්‍යයෙහි නෛරුක්තිකවිධියෙන් හා තද්ධිත වෘත්තියෙන් ‘භගවත්’ නම් වනසේකි. තවද, බුදුහු ලොභ ද්වෙෂ මොහ විපරිත මනස්කාරාදි ක්ලෙශ ශතසහස්‍රයන් හා සංක්ෂෙපයෙන් ක්ලෙශස්කන්ධාභිසංස්කාර මෘත්‍යු දෙවපුත්‍ර මාරයන් භග්න කළහෙයින් ‘භග්ගවාතිති භගවා ත්” යන වාක්‍යයෙහි “භඤ්ජ අවමද්දනෙ” යන ධාතුහු කෙරෙන් කෘදන්ත සාධන ක්‍රමයෙනුත් ‘භගවත්’ නම් වනසේකි.

තවද, බුදුහු.

* මේ ගාථාවෙහිද “භගවාති වචනං සෙට්ඨං”යනාදිගාථාවෙහිද පදාර්ථ සන්නය මතු පොතෙහිම දක්නාලැබෙන බැවින් අ[illegible] නොයෙදීමු.

50 "ඓශ්වර්යස්‍ය සමග්‍රස්‍ය-ධර්මස්‍ය යශසඃ ශ්‍රියඃ
කාමස්‍යාථ ප්‍රයත්නස්‍ය-ෂණ්ණාම් භග ඉතිශ්‍රැතිඃ"

කියනලද "ඓශ්වර්ය පුණ්‍ය යශඃ ශ්‍රී සංකල්ප සිද්ධි ප්‍රයත්න" යන ෂාඩ්ගුණ්‍යයෙන් පරිපූර්ණහෙයින් "භගොයස්‍යාස්තීති භගවාන්" යන වාක්‍යයෙහි යථොක්ත තද්ධිතව්‍යුත්පත්ති නයින්ද 'භගවත්' නම් වනසේකි.

තවද, බුදුහු කුශලාදී ධර්මයන් පඤ්චස්කන්ධ ද්වාදශායතනාෂ්ටාදශධාතු චතුස්සත්‍යද්වාවිංශතීන්ද්‍රියද්වාදශාඞ්ගප්‍රතීත්‍ය සමුත්පාද චතුස්මෘති ප්‍රස්ථාන සම්‍යක්ප්‍රධානාදිවශයෙන් විභාගකළහෙයින් "විභත්තවාතිති භගවාන්"යනවාක්‍යයෙහි "භාජ-පෘථක්කර්මණි" යන ධාතුහු කෙරෙන් පූර්වොක්ත කෘදන්තනාමවශයෙනුත් 'භගවත්' නම් වනසේකි තවද, බුදුහු දිව්‍යබ්‍රහ්මාර්‍ය විහාර කාය චිත්තොපධි විවේක ශූන්‍යතා ප්‍රණිහිතානිමිත්තවිමොක්ෂ පඤ්චාභිඥාදිවූ ලෞකික ලොකොත්තර උත්තරි මනුෂ්‍යධර්මයන් භජනශීලහෙයින් "භත්තවාතිති භගවාන්" යනවාක්‍යයෙහි "භජ-සෙවායම්" යන ධාතුයෙන් කෘද්විධික්‍රමයෙනුත් 'භගවත්' නම් වන සේකි, තවද, බුදුහු කාමරූපාරූපසඞ්ඛ්‍යාත භවත්‍රයෙහි තෘෂ්ණා ගමනය අභීක්ෂ්ණ මාර්ගඥාන මුඛයෙන් වාන්තකළහෙයින් "භවෙසු වාන්තගමනොඉතිභගවාන්"යනසමාසවිධියෙන් හා නෛරුක්තික නයිනුත් 'භගවත්' නම් වනසේකි; තවද-

"භගවාති වචනං සෙට්ඨං-භගවාති වචනමුත්තමං
ගරුගාරවයුත්තො සො-භගවා තෙන වුච්චති"

යනුහෙයින් බුදුහු අපරිමිතනිරුපමප්‍රභාව ශීලාද්‍යශේෂගුණ විශෙෂ සමන්විතත්වයෙනුත් 'භගවත්'නම්වනසේකි. තවද,බුදුහු සර්වානර්ථපරිහාර පූර්වඞ්ගමවූ සර්වශෙෂ හිතසුඛ විධාන තත්පර නිරතාතිශය ප්‍රයොග සම්පත්තියෙන් දෙව්මිනිසුන්සහිතවූ සත්ව ලොකයාහට අත්‍යන්තොපකාරකත්වයෙනුත් 'භගවත්' නම් වන සේකි. තවද, බුදුහු ප්‍රමාණාතික්‍රාන්ත ලොකධාතුගත අනන්ත, පර්‍යන්ත සත්වයන්ට උත්තම ගෞරවස්ථානීයවූ හෙයිනුත් 'භග

---

50 සමග්‍රස්‍ය, සියළු, ඓශ්වර්යස්‍ය, ඉසුරටද, ධර්මස්‍ය, පුණ්‍යයටද යශසඃ යසසටද, ශ්‍රිය , ශ්‍රීයාවටද කාමස්‍ය, සංකල්පසිද්ධියටද, අථ නැවත, ප්‍රයත්නස්‍ය, වීර්යයටද, (යන) ෂණ්ණාම්, ෂට්විධධර්මයන් ( , භගඃඉති, භගයයි, ශ්‍රැතිඃ, ප්‍රසිද්ධියක් තොතොත් ශබ්ද(ව්‍යවහාර) යක්වේ.

වත්' නම් වන සේක. අනිකුදු, "භග්ගරාගොති භගවා, භග්ගදොසොති භගවා, භග්ගමොහොති භගවා,භග්ගමානොති භගවා, භග්ගදිට්ඨීති භගවා, භග්ගකණ්ටකොති භගවා, භග්ගකිලෙසොති භගවා, භජි විභජි පවිභජි අනුත්තරං ධම්මරතනන්ති භගවා, භවානං අන්තකරොති භගවා,භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා" යනාදීන් ප්‍රඥාවතුන්ට අග්‍රවූ දම්සෙනෙවිසැරියුත් මහතෙරුන්වහන්සේවිසින් වදාළ නිද්දේශ පාලි නිර්දිෂ්ටාවූ ප්‍රභෙදයෙනුත් බුදුහු 'භගවත්' නම් වනසේක. තවද,

51 "ගුණෛරතුල්‍යෛර්නිඛිලෛස්සමාගමා
දශෙෂදෙෂොපශමාච්ච නො ගුරුඃ
සමග්‍රමාහාත්ම්‍ය විභූෂිතො යතඃ
ප්‍රකීර්ත්‍යතෙ 'සමාද්භගවා නසාවිති'"

කියනලද සමග්‍රගුණමාහාත්ම්‍යයෙන් විභූෂිතහෙයිනුත් 'භගවත්' නම් වනසේක.

"භග්ගරාගො භග්ගදෙසො-භග්ගමොහො අනාසවො
භග්ගාස්ස පාපකා ධම්මා-භගවා තෙන පවුච්චති"

'භග්ගරාගො, යම්හෙයකින් මේ තථාගතතෙම භග්නවූ රාග ඇත්තේද; භග්ගදෙසො, භග්නවූවෙෂ ඇත්තේද; භග්ගමොහො භග්නවූ මොහඇත්තේද; අනාසවො, ක්ෂීණවූ චතුරාශ්‍රවයන් ඇති හෙයින් අනාශ්‍රවද; අස්ස, මේ තථාගතයාවිසින්; පාපකා ධම්මා, සියලුඅකුශලධර්මයෝ; භග්ගා, යම්හෙයකින්නසනලදහුද; තෙන, එහෙයින්; භගවාති පවුච්චති, භගවායයි කියනුලැබේ.* යෙන, යම්හෙයකින්; භගවාඉතිවචනං, භගවා යන මේ වචනය තෙම; සෙට්ඨං, ශ්‍රෙෂ්ඨගුණසහවරත්වයෙන් ශ්‍රෙෂ්ඨවාචකවූ වචනයෙක්ද-නොහොත්-ශ්‍රෙෂ්ඨයා හඟවනහෙයින් ශ්‍රෙෂ්ඨද;භගවාති වචනං, භගවායනමේ වචනයතෙම; උත්තමං, උත්තමගුණසහචරත්වයෙන් උත්තමයකියන්නාවූ වචනයෙක්ද—නොහොත්—උත්තමයා හඟවනහෙයින් උත්තමද; සො, ඒ. භාග්‍යවත්තෙම; යෙන, යම්කාරණයකින්; ගරු, තුන්ලොවාසීන්ට ගරුද; ගාරව

(51) නිඛිලෛඃ, සියළු; අතුල්‍යෛඃ, අසමානවූ; ගුණෛඃ, ගුණයෙන්; සමාගමාත්, එක්වීමඇතිබැවින්ද; අශෙෂ දෙෂොපශමාච්ච, සකලදෙෂ ව්‍යපශමනයඇතිබැවින්ද; නොගුරුඃ, අපගේ ගුරුතෙම;යතඃ,යම්හෙයකින්; සමග්‍රමාහාත්ම්‍යවිභූෂිතඃ,(මෙසේ) සියළු ගුණ මහත්තත්වයෙන් අලඞ්කෘතවූසේක්ද; අසමාත්, මේ කාරණයෙන්; අසෞ, මේ ගුරුතෙම; භගවාන්ඉති, භගවත්යයි; ප්‍රකීර්ත්‍යතෙ, කියනු ලැබේ.

* මෙහි යටදැක්වූ ගාථා දෙකක පදාර්ථ සන්නාත්පෙනේ. මේ වනාහි ඒ ඒ ගාථාවින් ලඟම නොදැක්වා මෙහි යොදනලද්දේ සමුදායාර්ථ දර්ශනය පලමුකොට අභිමතහෙයිනැයි සලකනු.

යුක්තො, යම්හෙයකින් ගරුගුණයෙන් යුක්තද-හෙවත්-ගෞරවාහීද; තෙන, එහෙයින්; භගවා පවුච්චති, භගවායයි කියනුලැබේ-නොහොත්-ගාරවයුක්තො, සීලාදි ගරුගුණයෙන් යුක්තවූ; සො ගරු, ඒ ත්‍රිලෝගුරු සම්‍යක්සම්බුද්ධතෙම; භගවා පවුච්චති, භගවායයි කියනුලැබේ. භාග්‍යවතො, යම්හෙයකින්; භාග්‍යවා, ලොව් ලොව්තුරා සැප නිපදවන්නාවූ දානසීලාදි කෙළපැමිණි භාග්‍ය ඇත්තේද; භග්ගවා, රාග ද්වේෂාදි සකලක්ලේශ ශත්‍රූන් අභිද්මාර්ගඥානශස්ත්‍රයෙන් පැහැර භග්නකෙළේද; භගෙහි, ඓශ්වර්යාදි ෂඩ්විධ භගධර්මයෙන් හා ද්වතිස්වර මහාපුරුෂ ලක්ෂණයෙන් අසූඅනුව්‍යඤ්ජනයෙන්; යුත්තොච, යුක්තද; විභත්තවා, කුශලාදීන් ස්කන්ධාදිවශයෙන්ද ස්කන්ධාදීන් කුශලාදිවශයෙන්ද විභාගකොට දෙසීද; නොහොත්-සතිපට්ඨාන සම්මප්පධාන ඉද්ධිපාද ඉන්ද්‍රිය බල බොජ්ඣඞ්ග මග්ගඞ්ග ඛන්ධායතනධාතු සච්ච පටිච්චසමුප්පාදාදි ධර්මයන් දිව්‍ය මනුෂ්‍යයන්ට නානාප්‍රකාරයෙන් විභාගකොට දැක්වීද; භත්තවා, දිව්‍යබ්‍රහ්මාර්යවිහාරාදීන් භජනය සෙවනය කෙළේද; නොහොත්—අමරසාදීන්ට භාගීද, හිමිද; නා ගුරුළු දෙව් බඹ මිනිස් ඈ බොහෝ භක්තයන්ඇත්තේද; භවෙසු, තුන් භවයෙහි; වන්තගමනො, ආර්යමාර්ගඥාන මුඛයෙන් වමනය කරණලද තෘෂ්ණා සඞ්ඛ්‍යාත ගමන්ඇත්තේද; තතො, එහෙයින්; භගවා, භගවා නම් වේ.


"භගී භජී භාගී විභත්තවා ඉති
අකාසි භග්ගන්ති ගරූති භාග්‍යවා
බහූහි ඤායෙහි සුභාවිතත්තනො
භවන්තගො සො, භගවාති වුච්චති"

භගීඉති, ඓශ්වර්යාදි ෂඩ්විධ භගධර්මයන් ඇත්තේනුයි කියාද; භජීඉති, මාර්ග ඵල නිර්වාණ සඞ්ඛ්‍යාතවූ ආර්යධර්මරත්නයද ගැඹුරුවල්හිවූ දුරු සෙනසුන්ද සෙව්නුයිකියාද; භාගීඉති, චීවර පිණ්ඩපාතාදි චතුර්විධ ප්‍රත්‍යයන්ටද අර්ථරස ධර්මරස විමුක්තිරසයටද අධිසීල අධිචිත්ත අධිප්‍රඥාවටද භාගීනුයිකියාද; විභත්තවා ඉති, ලෞකික ලොකොත්තර ධර්මයන් ස්කන්ධායතනධාත්වාදිවශයෙන් විභාගකෙළේනුයි කියාද; භග්ගං අකාසිඉති, රාගාදි සියලු පාපධර්මයන් බොධිමණ්ඩයෙහිදීම වාසනාහා සමග භග්නකෙළේනුයි; හෙවත්-නැසීනුයි කියාද; ගරුඉති, සතරාමර ලොකයා විසින් පාෂාණච්ඡත්‍රයක්මෙන්. ගරුකටයුතුබැවින් ගරුනුයි කියාද; භාග්‍යවාඉති, දානසීලාදි පාරමිතා සාගරයෙහි පාරප්‍රාප්තබැවින් කොටිප්‍රාප්තවූ භාග්‍යඇත්තේ නුයි කියාද, බහූහිඤායෙහි කායභාවනාදි බොහෝ භාවනාක්‍රමයෙන්; සුභාවිතත්තනො, මනාකොට වඩනාලද සිත්ඇති; භවන්තගො, සියලුභවයන්ගේ කෙළවරයයි කියනලද නිර්වාණයට ගියාවූ; සො, ඒ ගුරුතෙම; භගවාඉති වුච්චති, භගවායයි කියනු ලැබේ.

නව අරහාදි බුදුගුණ විභාගය

— නිමි. —

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු